# වාර්ෂික වාර්තාව 2017



සී/ස හලාවත වැවිලි සමාගම
சிலாபம் பெருந்தோட்ட நிறுவனம்
**CHILAW PLANTATIONS LTD**

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය
தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சு
Ministry of Public Enterprise Development

# අන්තර්ගතය


| | පිටු අංක |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | 02 |
| මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා | 03 - 04 |
| සභාපතිතුමන්ගේ පණිවිඩය | 05 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 06 - 07 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 08 |
| කළමනාකරණ විමසුම | 09 - 23 |
| මූල්‍ය සමාලෝචනය | 24 - 28 |
| ආයතනික පාලන ප්‍රකාශය | 29 |
| අවධානම් කළමනාකරණය | 30 - 31 |
| විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 32 |


## මූල්‍ය වාර්තා


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 33 - 35 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 36 |
| විගණකාධිපති වාර්තාව | 37 - 39 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 40 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 41 |
| ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 42 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 43 |
| ගිණුම්කරණ, ප්‍රතිපත්ති සහ සටහන් | 44 - 72 |

| | |
|---|---|
| දස වසරක සාරාංශය | 73 |
| වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය | 74 |
| පෙරකලාසි අයදුම් පත | 75 |
| ආයතනික විස්තරය | කවරයේ ඇතුළත |

# දැක්ම

පොල් කර්මාන්තයේ තිරසර සංවර්ධනය මඟින්
ශ්‍රී ලංකා ආර්ථිකයට උපරිම දායකත්වයක් ලබාදීම.

# මෙහෙවර

පොල් පාදක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා තමන් සතු සීමිත සම්පත් ඵලදායී ලෙස හා කාර්යක්ෂම ලෙස භාවිතා කරමින් පිළිගත් ප්‍රතිපත්ති මඟින් සේවකයන්ගේ සහ මහජනතාවගේ ජීවන තත්වය නංවාලීම.

# අගයන්

| | |
|---|---|
| අවංක බව | කණ්ඩායම් හැඟීම |
| අඛණ්ඩතාව | සවිබල ගැන්වීම |
| විනිවිදභාවය | නව්‍යකරණය |
| නායකත්වය | වෘත්තීයභාවය |

වගකීම සහ වගවීම

# මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා

| | 2017 | 2016 | වෙනස% |
|---|---|---|---|
| පොල් නිෂ්පාදනය ගෙඩි '000 | 11,651 | 16,522 | (29) |
| **සාරාංශ ප්‍රතිඵල** | **රු.' 000** | **රු.' 000** | **%** |
| අයභාරය | 516,178 | 383,090 | 34.74 |
| දළ ලාභය | 205,574 | 148,707 | 38.24 |
| පොලිය සහ බදු පෙර ලාභය | 160,112 | 117,454 | 36.32 |
| බදු පෙර ලාභය | 126,415 | 84,817 | 49.04 |
| බදු පසු ලාභය | 82,149 | 70,764 | 16.09 |
| රඳවාගත් ලාභය | 747,876 | 695,727 | 7.50 |
| දැව සංචිතය | 82,328 | 61,841 | 33.13 |
| ගෙවන ලද ලාභාංශ | - | 30,000 | - |
| සමුච්චිත මුළු ලාභාංශ (1992-2016) | 456,650 | 456,650 | - |
| **මූල්‍ය තත්වය** | | | |
| ජංගම නොවන වත්කම් | 1,062,090 | 978,182 | 8.58 |
| මේරු/නොමේරු වගා | 802,088 | 728,533 | 10.10 |
| ජංගම වත්කම් | 293,680 | 300,494 | (2.27) |
| තොග | 58,754 | 100,759 | (41.69) |
| කෙටි කාලීන ආයෝජන (ස්ථාවර තැන්පතු) | 190,312 | 140,868 | 35.10 |
| මුළු වත්කම් | 1,355,769 | 1,278,676 | 6.03 |
| ජංගම වගකීම් | 120,785 | 134,591 | (10.26) |
| ජංගම නොවන වගකීම් | 287,108 | 248,358 | 15.60 |
| කොටස් ප්‍රග්ධනය | 200,000 | 200,000 | - |
| කොටස් කරුවන්ගේ අරමුදල් | 947,876 | 895,727 | 5.82 |
| **මූලික දර්ශක** | | | |
| ජංගම අනුපාතය (වාර) | 2.43 | 2.23 | 8.90 |
| ක්ෂණික අනුපාතය (වාර) | 1.94 | 1.48 | 31.06 |
| දළ ලාභ අනුපාතය | 39.83 | 38.82 | 2.60 |
| කොටසක ඉපයීම රු. | 4.07 | 3.48 | 16.95 |
| සාමාන්‍ය ස්කන්ධයට ආපසු ලැබීම් (ROE) % | 8.91 | 8.08 | 10.24 |
| ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම් (ROCE) % | 12.96 | 10.27 | 26.29 |
| ණයගැති අනුපාතය | 0.30 | 0.30 | - |
| කොටස් කරුවන්ගේ අරමුදල් අනුපාතය % | 69.91 | 70.05 | (0.20) |
| පොලි ආවරණය වාර | 4.75 | 3.60 | 32.03 |


අයභාරය
රු. (මිලියන)
516
383
35%
2016
2017
2016 - LKR 383 Mn.
2017 - LKR 516 Mn.


දළ ලාභය
රු. (මිලියන)
206
149
38%
2016
2017
2016 - LKR 149 Mn.
2017 - LKR 206 Mn.


බදු පෙර ලාභය
රු. (මිලියන)
126
85
48%
2016
2017
2016 - LKR 85 Mn.
2017 - LKR 126 Mn.


දළ ලාභ අනුපාතය
%
40%
39%
3%
2016
2017
2016 - 39%
2017 - 40%


මුළු වත්කම්
රු. (මිලියන)
1356
1279
6%
2016
2017
2016 - LKR 1,279 Mn.
2017 - LKR 1,356 Mn.


කොටස් හිමියන්ගේ
අරමුදල
රු. (මිලියන)
948
896
6%
2016
2017
2016 - LKR 896 Mn.
2017 - LKR 948 Mn.


මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්
ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය
රු. (මිලියන)
180
76
137%
2016
2017
2016 - LKR 76 Mn.
2017 - LKR 180 Mn.


කෙටි කාලීන ආයෝජන
රු. (මිලියන)
190
141
35%
2016
2017
2016 - LKR 141 Mn.
2017 - LKR 190 Mn.


ප්‍රාග්ධන වියදම්
රු. (මිලියන)
115
103
12%
2016
2017
2016 - LKR 103 Mn.
2017 - LKR 115 Mn.


කොටසක ඉපයීම
රු.
4.07
3.48
17%
2016
2017
2016 - Rs. 3.48
2017 - Rs. 4.07


ප්‍රාග්ධන යෙදවීමට
ආපසු ලැබීම් ROCE
%
12.96%
10.27%
26%
2016
2017
2016 - 10.27%
2017 - 12.96%

## සභාපතිතුමා / ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවුඩය

2017 මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සීමාසහිත හලාවත වැවිලි සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් හා සභාපති වශයෙන් ඉදිරිපත් කිරීමට ලැබීම සම්බන්ධයෙන් මම ඉතාමත් සතුටට පත්වෙමි.

වර්ෂය පුරාවට පැවති අයහපත් කාලගුණ තත්වයන් වැනි විවිද අභියෝගයන්ට මුහුණදෙමින් හලාවත වැවිලි සමාගම 2017 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් මිලියන 516 ක වාර්තාගත අලෙවි ආදායමක් සමඟ රුපියල් මිලියන 82 ක ශුද්ධ ලාභයක් අත්කර ගන්නා ලදී. හලාවත වැවිලි සමාගම වර්ෂ 2008 දී රජයට පවරා ගැනීමෙන් පසුව අත්කර ගන්නා ලද ඉහළම ලාභය මෙය වේ. මේ සඳහා වියදම් පාලනය කිරීමෙහිලා ගන්නා ලද උපාය මාර්ගයන්, සේවකයින්ගේ අප්‍රමාණ කැපවීම හා ඵලදායි ලෙස බෝග විවිධාංගීරණය වැනි සාධක සමාගමෙහි කාර්යසාධනය වර්ධනයට හේතුවිය. අමතරව වෙළඳ පොලෙහි පැවති මිල ගණන් ඉහළ ආදායමක් වාර්තා කිරීමට බලපාන ලද හේතු සාධකයක් විය.

### පොල්

2016 වර්ෂය ට සාපේක්ෂව පොල් අස්වැන්න 29% ක පහළ යාමක් 2017 වර්ෂයේ වාර්තා විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමස්ථ රටෙහි පොල් නිෂ්පාදනය පහළ ගිය අතර, එලෙසම සමාගමෙහි පොල් අස්වැවන්න ද අඩු විය. කෙසේ වෙතත් වර්ෂ 2016 ට සාපේක්ෂව 68% කින් පොල් ගෙඩියක අලෙවි මිල ඉහලයාමක් 2017 වර්ෂයේදී පෙන්නුම් කළ අතර, එම අගය රුපියල් 42/- කි. 2016 වර්ෂයේදී එම අගය රුපියල් 25/- ලෙස සටහන් විය. පොල් නිෂ්පාදනය පහළ යාමට පෙර වර්ෂයන් දෙකෙහි පැවති අයහපත් කාලගුණික තත්වය මේ සඳහා හේතු වූ අතර, එය ඉදිරි වර්ෂවලටත් බලපානු ඇතැයි සිතිය හැක.

### පොල් මත අගය එකතු කළ නිෂ්පාදන

හලාවත වැවිලි සමාගම මෙම වර්ෂය තුලදී කොප්පරා කිලෝ ග්‍රෑම් 242,250 ක් නිෂ්පාදනය කල අතර, එහි එක් කිලෝ ග්‍රෑමයක විකිණුම් මිල රු. 199/- ක් විය. එමෙන්ම පළුගස්වැව වත්ත තුළ ස්ථාපිත පොල් තෙල් මෝල ආශ්‍රයෙන් පොල් තෙල් ලීටර් 8,380 ක් නිෂ්පාදනය කිරීමට හැකි වූ අතර එම නිෂ්පාදිත පොල් තෙල් සඳහා වෙළඳපොල තුළ ඉහළ ඉල්ලුමක් පවතී. තවදුරටත් නිෂ්පාදිත ප්‍රමාණය හා එහි ගුණාත්මක භාවය වැඩිකිරීම සඳහා නිසි උපාය මාර්ගයන් ආයතනය මගින් සැලසුම්කර ඇත.

### කජු

හලාවත වැවිලි සමාගම වර්ෂය ඇතුලතදී වියලි කජු කිලෝ ග්‍රෑම් 34,289 ක් නිෂ්පාදනය කල අතර, ශ්‍රී ලංකාවේ කජු නිෂ්පාදකයින් අතරින් ප්‍රධාන නිෂ්පාදකයෙකු ලෙස අප සමාගම හැඳින්විය හැක. එම නිෂ්පාදිත වියලි කජු භාවිතා කරමින් පිරිසැකසුම් කරන ලද කජු කිලෝ ග්‍රෑම් 2,154 ක් අප සැකසුම් මධ්‍යස්ථානයේදී නිෂ්පාදනය කරන ඇත. මෙම නිෂ්පාදන තුළින් වැඩි ප්‍රතිලාභයක් ලබා ගැනීමට නම් අගය එකතු කල භාණ්ඩ නිෂ්පාදනය කිරීම ප්‍රධාන උපායමාර්ගයක් ලෙස දැක්විය හැක.

### ප්‍රාග්ධන ආයෝජනය

2017 මූල්‍ය වර්ෂය තුල සමාගම සමස්ථ ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 115 ක් වැය කර ඇති අතර, එතුළින් රුපියල් මිලියන 82 ක් පොල් නව වගා සහ යටි වගා වෙනුවෙන් ද, රුපියල් මිලියන 2 ක් කජු සහ අනෙකුත් බහු වාර්ෂික අතුරු බෝග සඳහාද, තවත් රුපියල් මිලියන 31 ගොඩනැගිලි ඉදිකිරීමට හා යන්ත්‍ර සූත්‍ර වැනි දෑ වෙනුවෙන් ද ආයෝජනය කර ඇත.

### සුභ සාධනය

හලාවත වැවිලි සමාගම සෑම විටම සමාජීය වගකීම් හඳුනාගනිමින් හා තිරසරව කටයුතු කරමින් අපගේ ව්‍යාපාර ක්‍රමෝපායන් මතින් හැසිරවීම කරනු ලැබේ. සේවකයින්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම වෙනුවෙන් සමාගම කටයුතු කරන අතර, තවද අප විසින් සමාජීය හා පාරිසරික වගකීම් හඳුනාගනිමින් කටයුතු කරන බවද දැන්වීමට කැමැත්තෙමි. එහිදී වතු සේවකයින්ගේ වතු නිවාස වල වහල ප්‍රතිසංස්කරණය, වතු නිවාස අලුත්වැඩියාව, සනීපාරක්‍ෂක කටයුතු සැපයීම, ගං වතුර අවස්ථාවන්හිදී ප්‍රජාව වෙත අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදා දීම හා රටෙහි බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි සහන මිලක් යටතේ ප්‍රජාව වෙත  මාළු පොල් නිකුත් කිරීම වැනි දෑ දැක්විය හැක.

### අනාගත අපේක්ෂාවන්

ඉදිරියේදී ඇති විය හැකි අභියෝගයන්ට මුහුණ දීම සඳහා සමාගමෙහි තිරසාරත්වය දියුණු කිරීමෙහිලා නව වගාවන් ස්ථාපිත කිරීම, යෝග්‍ය කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම, බෝග විවිධාංගීකරණය සහ ප්‍රධාන මෙහෙයුම් ආදායම් මෙන්ම අනෙකුත් ආදායම් ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම් උපයා ගැනිමද ප්‍රධාන වේ. පුත්තලම් දිස්ත්‍රික්කය සඳහා විශේෂයෙන් බලපානු ලබන අහිතකර කාලගුණ තත්වයන්ට මුහුණදීම සඳහා නූතන ජල සම්පාදන පද්ධති භාවිතා කිරීම, බෝග විවිධාංගීකරණ උපායමාර්ග වැනි දෑ සඳහා අනුගත වීම මගින් භූමිය හා ශ්‍රමය භාවිතයෙන් උපරිම නිෂ්පාදනයක් ලබා ගත හැකිය.

හලාවත වැවිලි සමාගම සතු දකුණු ආසියාවේ විශාලතම පොල් වත්ත වන පළුගස්වැව වත්ත ආදර්ශ පොල් වත්තක් ලෙස සංවර්ධනය කිරීම තුලින් ශිෂ්‍යයින්ගේ හා අනෙකුත් ප්‍රජාවට පොල් ක්ෂේත්‍රය පිළිබඳව මෙන්ම අගය එකතු කල නිෂ්පාදන ක්‍රියාවලි පිළිබඳව අධ්‍යනය කළ හැකි අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් බවට සංවර්ධනය වෙමින් පවතී.

### තුති පිදුම

හලාවත වැවිලි සමාගම ලාභදායි ලෙස හා සමස්ථ රටෙහි ජනතාවට වඩාත් ප්‍රයෝජනවත්ව රටෙහි සමස්ථ සම්පත් පරිහරණය කරවීමට අවශ්‍ය මගපෙන්වීම දෙනු ලබන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටද, හලාවත වැවිලි සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී සමග හලාවත වැවිලි සමාගමෙහි දියුණුවට කැපවන සියළුම අංශයන් නියෝජනය කරන නිලධාරී මඩුල්ලටද, සේවක හා කම්කරුවන් සියළුම දෙනාටද ඉහත ආයතනික ප්‍රගතිය අත්කරගැනීමට උරදීම වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තූතිය මෙයින් පුද කර සිටිමි.

එමෙන්ම අපගේ ව්‍යාපාර සමග අඛණ්ඩව විශ්වාසය තබමින් හා සහයෝගය ලබා දෙමින් ක්‍රියාකල ප්‍රජාව නියෝජනය කරන පාරිභෝගිකයින්, තැරැව්කරුවන්, පොල් ගැණුම්කරුවන්, භාණ්ඩ සපයන්නන්, ව්‍යාපාර බැංකු, වෘත්තීය සමිති නියෝජිතයින් ඇතුළු සමස්ථ ප්‍රජාවට මාගේ හෘදයාංගම ස්තූතිය මෙයින් පුද කර සිටිමි.



**සභාපති/ප්‍රධාන විධායක නිලධාරි**
**හලාවත වැවිලි සමාගම**



**වී.කේ.සී. හේරත් මහතා**

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී**

වී.කේ.සී. හේරත් මහතා 2016 ජුලි 14 වන දින සී/ස හලාවත වැවිලි සමාගමෙහි සභාපති / අධ්‍යක්ෂක මණ්ඩලයේ සමාජිකයකු ලෙස වැඩ භාරගන්නා ලදී. ඔහු, කුරුණෑගල පාරම්පරික ව්‍යාපාරික පවුලකින් පැවත එන සර්ව නිපුණ ව්‍යාපාරිකයෙකි. ඔහු පොල් වතු හිමියකු වන අතර ඔහු සතුව ඇති ව්‍යාපාරික නිපුණතාවය සී/ස හලාවත වැවිලි සමාගමේ අභිවෘද්ධිය වෙන්වෙන් ප්‍රයෝගිකව යෙදෙව්වේය.

වී.කේ.සී. හේරත් මහතා ඔහුගේ වෘත්තිය ප්‍රගමනය සමුද්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයෙන් ආරම්භ කල අතර මෝටර් රථ කර්මාන්තයේ වසර 33ට වැඩි පලපුරුද්දක් ඇත. තවද ඔහු ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ කුරුණෑගල ඉන්ධන පිරවුම්හල් නියෝජිත ධුරයක් දරයි.

වී.කේ.සී. හේරත් මහතා දක්ෂ ව්‍යවසායකයෙකු වන අතර ජාත්‍යන්තර ව්‍යාපාරික සම්බන්ධතා සහ රැකියා අවස්ථා උත්පාදනය මඟින් දේශීය ආර්ථිකයට අතිවිශාල වශයෙන් දායකත්වයක් ලබා දී ඇත. සමාජය වෙත ඉටුකරන ලද අතිවිශාල සේවාව වෙනුවෙන් 2017 වර්ෂයේදී ලංකා ජනසන්නිවේදකයන්ගේ සංගමය විසින් MASSCO සම්මානය පිරිනමන ලදි.

වී.කේ.සී. හේරත් මහතා ආසිරි ලුබ්රිකන්ට්ස්, ආසිරි එන්ටප්‍රයිසස් සහ ආසිරි ඔටෝ බජාජ්/ ශ්‍රී ලංකා සහ ආසිරි ලංකා ඉන්ධන පිරවුම්හලේ හිමිකරුවා වේ. චෙව්රෝන් (Chevron) ලුබ්රිකන්ට්ස් ලංකා පීඑල්සී විසින් ඔහුට 2014 වසර සඳහා වන හොඳම කාර්ය සාධන සම්මානය පිරිනමන ලදි.

දේශපාලන කටයුතු, ශ්‍රම වෙළඳපොල පිළිබඳ කටයුතු සහ සිවිල් සමාජයේ සහයෝගිතාවය සම්බන්ධයෙන් දිගුකාලීන පලපුරුද්දක් සහිත ඔහු පළපුරුදු නායකයකු සන්නිවේදකයකු සහ සාකච්ඡා කොට විසඳුම් සොයන්නෙකි.



**එම්.කේ.බී.සෙනවිරත්න මහතා (LLB)**

**විධායක අධ්‍යක්ෂ**

එම්.කේ.බී. සෙනවිරත්න මහතා 2015 මැයි 08 වන දින සී/ස හලාවත වැවිලි සමාගමේ විධායක අධ්‍යක්ෂ ලෙස පත්කරනු ලැබේ. තවද මනිෂ සෙනවිරත්න මහතා හලාවත වැවිලි සමාගමේ සභාපති තනතුර හිස්ව තිබූ 2016 පෙබරවාරි මාසයේ සිට 2016 අගෝස්තු මාසය දක්වා සභාපති ධූරයේ කාර්ය භාරය ඉටුකර ඇත.

මහනුවර නීතීඥයන්ගේ සංගමයට අනුබද්ධිතව ක්‍රියාකාරී අධිනීතිඥයෙකු ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන්ද වසර 10ට වැඩි කාලයක පලපුරුද්දක් ඔහු සතුය. තවද ප්‍රසිද්ධ නොතාරිස්, දිවුරුම් කොමසාරිස් සහ සමාගම් ලේකම්වරුන් ලෙසද ඔහු කටයුතු කරයි. මනිෂ සෙනවිරත්න මහතා මහනුවර නීතීඥයන්ගේ සංගමය නියෝජනය කරමින් ශ්‍රී ලංකා නීතීඥයන්ගේ සංගමයේ නියෝජිතයකු ලෙස කටයුතු කරයි.

ඔහු මහනුවර දිස්ත්‍රික්කය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ (ස්ථිර රැකියාවේ නොව - Free lance) නීති නිලධාරී ලෙස කටයුතු කරන අතර පේරාදෙනිය විශ්වවිද්‍යාල කවුන්සිලයේ දැනට පත්වී ඇති සමාජිකයකු ලෙස කටයුතු කරයි.

සෙනවිරත්න මහතා තරුණ කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යංශයේ සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ හිටපු අධ්‍යක්ෂවරයෙකි.

ඔහු කොළඹ ජාත්‍යන්තර සබඳතා සඳහා බණ්ඩාරනායක මධ්‍යස්ථානයේ ජාත්‍යන්තර සබඳතා ඩිප්ලෝමාධාරියෙකි.



**පී.සී. විජේවර්ධන මහතා**

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

පී.සී. විජේවර්ධන මහතා 2017.02.24 වන දින සී/ස හලාවත වැවිලි සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂක සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ සමාජිකයකු ලෙස පත්කරන ලදී.

ඔහු අධ්‍යක්ෂක මණ්ඩල සමාජිකයකු ලෙස රාජ්‍ය ආයතන බොහෝමයක කටයුතු කර ඇති අතර මාර්ග සංවර්ධන අධිකාරියේ උපදේශකයකු ලෙසද කටයුතු කරයි.

පී.සී. විජේවර්ධන මහතා විජය කන්ස්ට්‍රක්ෂන්ස් සහ ට්‍රැවල්ස් නිර්මාතෘ සහ හිමිකරු වෙයි.



**පී.බී.එස්.සී. නෝනිස් මහතා**

**අධ්‍යක්ෂ**

පී.බී.එස්.සී. නෝනිස් මහතා 2016 සැප්තැම්බර් 05 වන දින සී/ස හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලද අතර ඔහු මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂක මණ්ඩල සමාජික ලෙස කටයුතු කරයි.

පී.බී.එස්.සී. නෝනිස් මහතා මුදල් අමාත්‍යංශයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් තනතුර දරණ අතර රාජ්‍ය සේවයේ තිස් වසරක පලපුරුද්දක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණි නිලධාරියෙකි.

පී.බී.එස්.සී. නෝනිස් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි විද්‍යවේදි ව්‍යාපාර පරිපාලන විශේෂ උපාධිදරයෙකු වන අතර ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් (Flinders) විශ්වවිද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිදාරියෙකි. තවද ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය මගින් ආවසාරික සහතිකය ලබා ඇත.



**ලක්කදාස් අසායි මහතා**

**අධ්‍යක්ෂ**

ලක්කදාස් අසායි මහතා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය නියෝජනය කරමින් 2016 මැයි 14 වන දින සිට සී/ස හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සමාජිකයකු ලෙස කටයුතු කරයි.

ඔහු සී/ස හලාවත වැවිලි සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂකවරයකු ලෙස කටයුතු කරන අතර රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයේ අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්) ලෙස සේවය කරයි.

ඔහු යාපනය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව (ගෞරව) (2වන පංතිය ඉහළ පෙළ) උපාධිධාරියෙකි. ඔහු ජර්මනියේ ඩෝර්ට්මන්ඩ් විශ්වවිද්‍යාලය සහ පිලිපීන විශ්වවිද්‍යාලයේ නාගරික හා ප්‍රාදේශීය සැලසුම්කරණ පාසල විසින් එක්ව පවත්වනු ලබන ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්කරණය සහ කළමණාකරනය පිළිබඳ විද්‍යාපති උපාධිධාරියෙකි.



**එච්.එම්.එන්.සී. හේරත් මහතා**

**අධ්‍යක්ෂ**

එච්.එම්.එන්.සී. හේරත් මහතා 2015 මාර්තු 20 වන දින සී/ස හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල සමාජිකයකු ලෙස පත්කරන ලදි. ඔහු කොකෝ - සිලෝන් - එක්ස්පෝට් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේද කටයුතු කරයි.

ඔහු වයඹ D/C සහ ඔයිල් මිල්ස් ප්‍රයිවට් ලිමිටඩ්, ACME වෝටර් සිස්ටම්ස්, මෙට්රෝ මාකටින් යන සමාගම් වල නිර්මාතෘ/සභාපති වන අතර A.C.Coir එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි කළමනාකාර අධ්‍යක්ෂ වේ.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

## ප්‍රධාන කාර්යාලය

| | | |
|---|---|---|
| 01. | වී.කේ.සී.හේරත් මහතා | - සභාපති |
| 02. | එම්.කේ.බී. සෙනවිරත්න මහතා | - විධායක අධ්‍යක්ෂ |
| 03. | පී.සී. විජේවර්ධන මහතා | - ක්‍රියකාරි අධ්‍යක්ෂ |
| 04. | එ.ජී.ආර්.එම්.එම්. රණවීර මහතා | - සමාන්‍යාධිකාරි |
| 05. | ඩබ්.එල්.ඩී. ප්‍රනාන්දු මහතා | - සහකාර සමාන්‍යාධිකාරි (වැවිලි ඉන්ජිනේරු) |
| 06. | බී. හෙට්ටිආරච්චි මහතා | - සහකාර සමාන්‍යාධිකාරි (වැවිලි) |
| 07. | ආර්.එම්.ආර්.බී.රත්නායක මහතා | - ජ්‍යෂ්ඨ ගණකාධිකාරි |
| 08. | එච්.පී.එම්.ඩබ්. හේමචන්ද්‍ර මහතා | - ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 09. | එම්.එම්. මර්ලි මහතා | - වතු කළමනාකාර |
| 10. | ඒ.ඒ.අශෝක ආනන්ද මහතා | - වතු කළමනාකාර |
| 11. | ඩබ්.කේ. ප්‍රදීප් මහතා | - කළමනාකාර (තාක්ෂණ හා සංවර්ධන) |
| 12. | එ.එම්.ටී.එච්.බී. අතපත්තු මහතා | - කළමනාකාර (මානව සම්පත් හා පාලන) |
| 13. | එම්.කේ.එන්. අබේදීර මහතා | - කළමනාකාර (මූල්‍ය) |
| 14. | එ.එන්.එ.එස්. කරුණාතුංග මහතා | - කළමනාකාර (අලෙවි) |
| 15. | පී.එන්.එන්. ගුණසීල මෙනවිය | - කළමනාකාරිනි (සැලසුම් සහ පසුවිපරම්) |

## වතු අධිකාරිවරුන්

| | | |
|---|---|---|
| 16. | ජේ.එච්. ප්‍රනාන්දු මහතා | - වතු අධිකාරි, පලුගස්වැව වත්ත |
| 17. | ජී.එම්.ඒ. කරුණාතිලක මහතා | - වතු අධිකාරි, හලාවත වතු කලාපය |
| 18. | ඩී.එම්.ජී.ඒ. දිසානායක මහතා | - වතු අධිකාරි, බිංගිරිය වතු කලාපය |
| 19. | එම්.ජී.සී. ඩයස් මහතා | - වතු අධිකාරි, දිවුලපිටිය වතු කලාපය |
| 20. | බී.එම්.යු.බී. බස්නායක මහතා | - වතු අධිකාරි, මාදම්පේ වතු කලාපය |
| 21. | එ.එම්.ඩී.ගුණතිලක මහතා | - වතු අධිකාරි, තම්බපන්නි වතු කලාපය |

# කළමණාකරන විමසුම

## කෙටි හැඳින්වීම



### ජනසතුකරණය

1975 වර්ෂයේ සිට බලපවත්වනු ලැබූ සංශෝධිත ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය මඟින් සියළුම සමාගම් සතුව තිබූ වැවිලි ඉඩම් රජය සතුවිය. මෙකී වැවිලි ජනසතුකරණය සමඟ පවරාගත් ඉඩම් කළමණාකරනය කිරීම සඳහා විවිධ කළමනාකරණ ආයතනවලට භාරදීම නිසා වතු පාලනය කිරීම යම් තරමකට පුළුල් කාරණයක් විය.

### ජානතාවතු සංවර්ධන මණ්ඩලය (V)

ජනතාවතු සංවර්ධන මණ්ඩලය හා ජනසතුකරණයට පෙර වතු කිහිපයක් කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පැවති අතර ජනතා වතු සංවර්ධනය මඟින් නව ආයතනයක් 1976 දී, 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලදී. මෙම ආයතන දෙකට අමතරව ජනසතු කරනය කරන ලද සමහර වතු පාලනය කිරීම සඳහා නව ආයතන පිහිටුවන ලදී. ඒවාට උසවසම, ජනාවාස සහ සමූපකාර ඇතුලත්වේ. මෙහිදී මතුවූ තර්කය වූයේ කළමනාකරණ ආයතන කිහිපයකට ඉඩම් පැවැරීම නිසා කළමනාකරණය විවිධ ස්ථානවල ස්ථානගත වීමත්, ඒනිසා ඵලදාව අඩුවීම, අපතේයාම හා අකාර්යක්ෂමතාව වැනි අවාසි ඇති වූ බවත්ය. එම නිසා ඉඩම් ප්‍රතිසංස්කරණයේ ආසන්න බලපෑම කර්මාන්තයට වාසිදායක නොවීය.

මෙකී තත්වය යටතේ 1977 බලයට පත්වූ රජය කර්මාන්තයේ දියුණුව සඳහා කළමනාකාරී ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය නියමානුකූලව කිරීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව උසවසම, ජනාවාස හා සමූපකාර විසුරුවාහැරි අතර එකී ආයතන විසින් කළමනාකරණය කර තිබූ සියළුම දේපල ජනතා වතු සංවර්ධනයට හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට භාරදෙන ලදී. මෙම ආයතන දෙකෙහි කළමනාකරණ ව්‍යුහය කලාපීය මණ්ඩල ක්‍රමයක් මඟින් විමධ්‍යගත කරන ලදී. එමඟින් ඵලදායීතාවය නැංවීම අරමුණු කරගෙන ඉහත කී කලාපීය මණ්ඩල වෙත නිදහස හා තීරණ ගැනීමේ බලය ලබාදෙන ලදී.

### හලාවත වැවිලි සමාගම

හලාවත වැවිලි සමාගම 1987 අංක 23 දරණ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ සහ 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත සීමිත සමාගමකි (2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ යලි ලියාපදිංචි කර ඇත). සම්පූර්ණ කොටස් ප්‍රමාණය ස්වර්ණමය කොටස ද සමග භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් නිකුත් කර ඇත.

හලාවත වැවිලි සමාගම විසින් දැනට කළමනාකරණය කරන සියළුම වතු කළමනාකරණය පුද්ගලිකරණය කිරීම සඳහා 1992 වසරේදී ජනතාවතු සංවර්ධන මණ්ඩලය (V) හලාවත වැවිලි සමාගම නමින් රජයේ සමාගමක් බවට ස්ථාපිත කරන තෙක්ම පාලනය වූයේ ජනතාවතු සංවර්ධන මණ්ඩලය මඟින්ය.

# අපගේ වතු

## බිංගිරිය වතු කලාපය



| | | |
|---|---|---|
| මුළු භූමි ප්‍රමාණය | : | 1,509.66 හෙක්. (3,728.66 අක්.) |
| වතු පැවතීම | : | වතු ඒකක 25 |
| වතු ව්‍යාප්තිය | : | බිංගිරිය, කොබෙයිගනේ, පඩුවස්නුවර බටහිර ප්‍රා.ලේ.බල ප්‍රදේශය කුරුණෑගල දිස්ත්‍රික්කය |
| ප්‍රධාන බෝගය | : | පොල් |
| අනෙකුත් බෝග | : | ඩ්‍රැගන් ෆෘට්, කුරුඳු, කජු |

## හලාවත වතු කලාපය



| | | |
|---|---|---|
| මුළු භූමි ප්‍රමාණය | : | 645.57 හෙක්. (1,594.55 අක්.) |
| වතු පැවතීම | : | වතු ඒකක 12 |
| වතු ව්‍යාප්තිය | : | පල්ලම, ආරච්චිකට්ටුව, රස්නායකපුර ප්‍රා.ලේ.බල ප්‍රදේශය - පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කය |
| ප්‍රධාන බෝගය | : | පොල් |
| අනෙකුත් බෝග | : | කජු, කුරුඳු, ඩ්‍රැගන් ෆෘට්, අඹ |

## දිවුලපිටිය වතු කලාපය



| | | |
|---|---|---|
| මුළු භූමි ප්‍රමාණය | : | 424.49 හෙක්. (1,048.49 අක්.) |
| වතු පැවතීම | : | වතු ඒකක 14 |
| වතු ව්‍යාප්ති | : | දිවුලපිටිය, දංකොටුව, කටාන ප්‍රා.ලේ.බල ප්‍රදේශ - ගම්පහ සහ පුත්තලම් දිස්ත්‍රික් බල ප්‍රදේශ |
| ප්‍රධාන බෝගය | : | පොල් |
| අනෙකුත් බෝග | : | ගම්මිරිස්, රඹුටන්, ඩ්‍රැගන් ෆෘට් |

## මාදම්පේ වතු කලාපය



| | | |
|---|---|---|
| මුළු භූමි ප්‍රමාණය | : | 655.86 හෙක්. (1,619.97 අක්) |
| වතු පැවතීම | : | වතු ඒකක 12 |
| වතු ව්‍යාප්තිය | : | හලාවත, නාත්තන්ඩිය, උඩුබද්දාව, බිංගිරිය ප්‍රා.ලේ. බල ප්‍රදේශ - පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්ක |
| ප්‍රධාන බෝගය | : | පොල් |
| අනෙකුත් බෝග | : | ඩ්‍රැගන් ෆෘට්, කජු, අන්නාසි |

## පළුගස්වැව වත්ත



| | | |
|---|---|---|
| මුළු භූමි ප්‍රමාණය | : | 672.22 හෙක්. (1,660.38 අක්.) |
| වතු ව්‍යාප්තිය | : | ආරච්චිකට්ටුව |
| ප්‍රා.ලේ.බල ප්‍රදේශ | : | ආරච්චිකට්ටුව, පුත්තලම දිස්ත්‍රික්කය |
| ප්‍රධාන බෝගය | : | පොල් |
| අනෙකුත් බෝග | : | ඩ්‍රැගන් ෆෘට්, කජු |

## තම්භපණ්නි වතු කලාපය



| | | |
|---|---|---|
| මුළු භූමි ප්‍රමාණය | : | 1,825.43 හෙක්. (4,508.81 අක්.) |
| වතු පැවතීම | : | වතු ඒකක 21 |
| වතු ව්‍යාප්තිය | : | පුත්තලම, කල්පිටිය, වනාතවිල්ලුව ප්‍රා.ලේ.බල ප්‍රදේශ - පුත්තලම දිස්ත්‍රික්කය |
| ප්‍රධාන බෝගය | : | පොල් |
| අනෙකුත් බෝග | : | කජු |

## ප්‍රධාන ව්‍යාපාර - වතු කළමනාකරණය හා පොල් නිෂ්පාදනය

හලාවත වැවිලි සමාගම සතුව පවතින මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 5733.23 ක් වන අතර, එතුළින් හෙක්ටයාර් 3,815.94 ක පොල් වගා කොට ඇත. එම ඉඩම් පුත්තලම සිට කටුනායක දක්වා වයඹ පළාත තුල වෙරළ බඩ ප්‍රදේශයන් දක්වා පැතිරී ඇත. සමාගම සතු ඉඩම් තෙත් හා වියලි දේශගුණික කළාපයන් තුළ ව්‍යාප්තව පැවතීම මත එහි ඒකක නිෂ්පාදනය සංසන්දනාත්මකව එකිනෙකට වෙනස් වේ. වැඩි නිෂ්පාදනයක් අතරමැදි තෙත් කළාපය තුළද, අඩු නිෂ්පාදනයක් වියලි කළාපය තුළද වාර්තා වේ.

2016 වර්ෂයේදී පැවති දිගු වියලි දේශගුණික තත්වය මත පොල් අස්වැන්න සැලකිය යුතු මට්ටමින් අඩුවිය.

### පොල් නිෂ්පාදනය

| වසර | පොල් අස්වැන්න (ගෙඩි) | වෙනස % | ඵලදරන ගස් සංඛ්‍යාව | වෙනස % | පොල් ගසක සාමාන්‍ය ගෙඩි ගණන | ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය (මිලියන) | වෙනස |
|---|---|---|---|---|---|---|---|
| 1992 | 20,782,648 | 0 | 421,875 | | 49 | 2,296 | 0 |
| 1993 | 19,145,214 | -8 | 407,512 | -05% | 47 | 2,164 | -06% |
| 1994 | 21,382,314 | +12 | 426,722 | +03% | 50 | 2,622 | +21% |
| 1995 | 22,603,156 | +6 | 441,379 | +04% | 51 | 2,275 | +05% |
| 1996 | 19,336,658 | -14 | 421,716 | -04% | 46 | 2,546 | -08% |
| 1997 | 19,235,974 | -1 | 412,006 | -02% | 47 | 2,630 | +03% |
| 1998 | 18,921,808 | -2 | 415,718 | +01% | 46 | 2,522 | -04% |
| 1999 | 21,348,626 | +13 | 393,360 | -05% | 54 | 2,828 | +12% |
| 2000 | 23,216,882 | +9 | 399,454 | +02% | 58 | 2,396 | +09% |
| 2001 | 21,829,630 | -06 | 395,435 | -01% | 55 | 2,769 | -11% |
| 2002 | 15,031,795 | -31 | 413,465 | +05% | 36 | 2,392 | -14% |
| 2003 | 17,585,652 | +17 | 402,937 | -03% | 44 | 2,562 | +11% |
| 2004 | 18,354,614 | +04 | 401,162 | 00% | 46 | 2,591 | +01% |
| 2005 | 14,391,265 | -22 | 408,006 | +02% | 35 | 2,515 | -03% |
| 2006 | 17,070,324 | +19 | 411,968 | +01% | 41 | 2,785 | +11% |
| 2007 | 17,815,317 | +04 | 395,762 | -04% | 45 | 2,869 | +03% |
| 2008 | 16,280,051 | -09 | 378,333 | -04% | 43 | 2,908 | +01% |
| 2009 | 18,632,247 | +14 | 380,000 | 00% | 49 | 2,762 | -05% |
| 2010 | 18,256,007 | -2 | 340,586 | -10% | 54 | 2,317 | -16% |
| 2011 | 14,527,770 | -20 | 353,113 | +04% | 41 | 2,808 | +09% |
| 2012 | 15,807,753 | +09 | 312,456 | -12% | 51 | 2,940 | +05% |
| 2013 | 09,595,275 | -39 | 313,048 | +01% | 31 | 2,513 | -14% |
| 2014 | 12,969,381 | 35 | 283,449 | -9% | 46 | 2,870 | +14 |
| 2015 | 12,517,083 | -3 | 288,951 | 2% | 43 | 3,026 | +5 |
| 2016 | 16,522,290 | 32% | 304,043 | 5% | 54 | 2,845 | -7% |
| 2017 | 11,651,155 | -29% | 282,005 | -7% | 41 | 2,450 | -14% |




## පොල් යටි වගාව

පොල් වගාවක ඇති ගස් වල උපරිම ඵලදායි කාලය ඉක්මවා යාමෙන් නිෂ්පාදනය අවම වීමේදී නැවත යටි වගාවන් ස්ථාපිත කිරීම ආරම්භය ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතුවේ.

ඉදිරි අනාගතයේදී ඉහළ පොල් අස්වැන්නක් අපේක්ෂාවෙන් පොල් පැළ වගාවන් ස්ථාපිත කිරීම සඳහා විශාල ප්‍රාග්ධනයක් වැය කිරීම කරනු ලැබේ.




## බෝග විවිධාංගීකරණය හා සත්ව පාලනය

මහා පරිමාණයේ පොල් වගාවන් සිදුකරනු ලබන වගා හිමියන් පොල් වගාව බොහෝ විට ඒක බෝග වගාවක් ලෙසට කළමනාකරණය කරයි. ඒක බෝග වගාව තුළ අවම භූමි භාවිතයක් පෙන්නුම් කිරීම මෙන්ම අඩු ඵලදායිතාවයක් ඇතිව ඉඩම් කළමනාකරණයක් දක්නට ඇත. එබැවින් ඉඩම් කළමනාකරණය ඉහළ නැංවීම වස් අතුරු බෝග වගාවට හුරු වීම පොල් වගාවේදී උපරිම භූමි භාවිතයට ඇති ක්‍රමෝපාය වේ. එනමුදු, හලාවත වැවිලි සමාගමෙහි වතු වල අතුරු බෝග වගාව වඩාත් ප්‍රචලිත කිරීමට ඇති ප්‍රධාන බාධකයන් ලෙස වර්ෂාව මදි කම හා බොහෝ ස්ථානයන් වල නුසුදුසු පාංශු ලක්ෂණ පැවතීම තුල වගා කළ හැකි අතුරුභෝග සඳහා සිමාවන් පැනවී ඇත.

කෙසේ වෙතත් පවතින පාංශු ලක්ෂණ මත එම භූමියන් උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් සමාගමෙහි වතු වල පොල් වගාවට අමතරව කජු, රඹුටන්, කුරුඳු, ගම්මිරිස්, ඩ්‍රැගන් ෆෲට් යනාදිය වගා කොට ඇත. ඊට අමතරව පොල් වගාව තුළ සත්ව පාලන කටයුතු ලෙස මී ගව පාලනය හා බැටළු පාලන කටයුතු ද භූමි භාවිතය උපරිම කිරීමට හේතු සාධක වී ඇත.

## රඹුටන් වගාව

පාංශු ලක්ෂණයන් ගේ සුදුසුකම් මත අක්කර 50 ක පමණ රඹුටන් වගාවක් දිවුලපිටිය වතු කලාපයේ ස්ථාපිත කර ඇත. මෙම වතු ගම්පහ දිස්ත්‍රික්කයට අයත් බැවින් එහි රඹුටන් වගාවට සුදුසු දේශගුණික තත්වයක් පවතී.





## ගම්මිරිස් වගාව

ගම්මිරිස් වගාවද දේශගුණික ලක්ෂණ සලකමින් තෙත් හා අතරමැදි දේශගුණයක් පවතින දිවුලපිටිය වතු කලාපයට පමණක් සීමා වී ඇත.





## කුරුඳු වගාව

රටෙහි කුරුඳු සඳහා ඇති අධික ඉල්ලුම සලකමින් හා ඒ සඳහා හොඳ වෙළඳ පොළ තත්වයක් පැවතීම මත දිවුලපිටිය වතු කලාපයේ අඩු ඵලදායිතාවයකින් යුතු වතු හදුනාගනිමින් වර්ෂ 2011 දී කුරුඳු වගාව පළමු වරට ආරම්භ කරන ලදී. සමස්ථයක් වශයෙන් බිංගිරිය හා හලාවත වතු වල සුළු වශයෙන් වගා කොට ඇති භූමි ප්‍රමාණයත් සමඟ මේ වන විට අක්කර 27 ක පමණ කුරුඳු වගාව ව්‍යාප්ත කර ඇත.





## ඩ්‍රැගන් ෆෲට්

වියලි හා අතරමැදි කළාපයන් තුළ ව්‍යාප්තව වැඩෙන බෝගයක් වන බැවින් පළමු වරට බිංගිරිය වතු කලාපයේ කිණියම වත්ත තුළ ඩ්‍රැගන් ෆෲට් වගාව වර්ෂ 2008 දී ආරම්භ කරන ලදී. සමස්තයක් ලෙස වර්ෂ 2017 අවසානය වන විට බිංගිරිය, දිවුලපිටිය, මාදම්පේ හා පලුගස්වැව යන වතු වල අක්කර 31 ක පමණ වගාවන් ස්ථාපිත කර ඇත.





**වර්ෂ 2017 දී අතුරු බෝග ආදායම (රු.)**

| වත්ත | කජු | ගම්මිරිස් | රඹුටන් | ඩ්‍රැගන් ෆෲට් | කුරුඳු |
|---|---|---|---|---|---|
| තම්බපණ්ණි | 11,571,343 | - | - | - | - |
| බිංගිරිය | 702,015 | - | - | 1,261,435 | - |
| හලාවත | 980,050 | - | - | 2,990 | - |
| මාදම්පේ | - | - | - | 48,131 | - |
| දිවුලපිටිය | - | 177,600 | 946,000 | 459,810 | 1,300,680 |
| පළුගස්වැව | 200,940 | - | - | 38,719 | - |
| **එකතුව** | **13,454,348** | **177,600** | **946,000** | **1,811,085** | **1,300,680** |

## සත්ව පාලනය

පලුගස්වැව වත්තේ පවත්වාගෙන යනු ලබන මී ගව ව්‍යාපෘතියේ ලබා ගන්නා මී කිරි, මුදවපු මී කිරි හා යෝගට් බවට පත් කරමින් පලුගස්වැව වත්තේ හා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඇති අලෙවි මධ්‍යස්ථාන තුළින් පාරිභෝගිකයින් වෙත අලෙවි කිරීම කරනු ලැබේ.






### මී ගවයින් / බැටළුවන් සංඛ්‍යාව

| වත්ත | මී ගවයින් ගණන | බැටළුවන් ගණන |
|---|---|---|
| පලුගස්වැව | 300 | |
| හලාවත | 37 | |
| මාදම්පේ | 40 | 168 |
| බිංගිරිය | | 438 |
| එකතුව | 377 | 606 |



සත්ව පාලනයේදී ලැබෙන්නා වූ සත්ව වසුරු උසස් කාබනික පොහොරක් ලෙස භාවිතා කිරීම තුලින් පාංශු වයනය වැඩි දියුණු වීම සිදුවන බැවින් පොල් පැළ වගාවන්ට හා අතුරු බෝග වගාවන් සඳහා මෙම පොහොර භාවිතා කර ඇත.





## පාරිසරික බලපෑම්

### වර්ෂාව සහ පරිසර උෂ්ණත්වය

පොල් මලෙහි පරාගනයට හා එහි එල වර්ධනයට බලපානු ලබන ප්‍රධානතම සාධකයන් වනුයේ පරිසර උෂ්ණත්වය හා වර්ෂාව සමඟ පාංශු තෙතමනය වේ. පරිසර උෂ්ණත්වය ඉහල යාමත් සමඟ වාෂ්පීකරණයද වැඩි වීමෙන් පාංශු තෙතමනය අවම වීම ද අයහපත් ලෙස සිදු වේ.

අපගේ සියළුම වතු අතරමැදි තෙත් හා වියලි දේශගුණික තත්වයන් තුළ පිහිටීම මත වාර්ෂිකව පවතින අයහපත් දිගු වියලි දේශගුණික තත්වයන්ට මුහුණ පෑමට සිදු වේ. එමෙන්ම සියළුම වතු වැසි ජලය මූලික ජල සම්පාදනය ලෙස ගනිමින් පැවතීම ද අයහපත් ව බලපා ඇත. මෙම තත්වයන් ප්‍රභාසංස්ලේෂණයට ද අයහපත් ලෙස බලපෑමෙන් එහි ප්‍රතිඵලයක් ලෙස අඩු නිෂ්පාදනයක් ලැබීම දක්නට ඇත.

එමෙන්ම 2017 වර්ෂයේදී සාපේක්ෂව අඩු වර්ෂාපතනයක් හා අවම වැසි දින ගණනක් වාර්තා වී ඇත.










### වැසි ජලය එකතු කිරීම

පොල් ශාකය මුදුන් මූල පද්ධතියක් නොමැතිව මීටර් 2 ක් පමණ ගැඹුරට පැතිරුණු මූල මණ්ඩලයක් සහිත ශාකයක් වේ. ඒ හේතුවෙන් පොල් ශාකය සඳහා මතු පිට ජලය ප්‍රධාන සාධකයක් වේ. ඒකාකාරී වර්ධනයකට හා නිෂ්පාදනයට ක්‍රමාණුකූල ජල සම්පාදනය මහත් රුකුලක් වේ. එබැවින් දිගු වියලි කාලයන්හිදී මතු පිට ජල සංරක්ෂණ ක්‍රම ඉතා වැදගත් වේ.

මතු පිට ජල සංරක්ෂණයේදී වැසි ජලය ගබඩා කර ගැනීමට පතස් ප්‍රතිසංස්කරණය ඉතා වැදගත් සාධකයක් වන අතර, එමගින් වර්ෂා කාලයේදී මතු පිට ගලා යන ජලය එක් රැස්කර ගනිමින් එය වියලි කාලයන්හී ජල ප්‍රභවයක් ලෙස භාවිතා කිරීමට උපකාරී වේ.

## නව තාක්ෂණය

### අත්පරාගනය මගින් ජානමය වැඩිදියුණු කරන ලද බීජ පොල් නිෂ්පාදනය

පොල් ගස පර-පරාගනය වනු ලබන ශාකයකි. එබැවින් පරාගනයේදී අසල ඇති අඩු ඵලදායිතාවයකින් යුතු දුර්වල පරාග හටගන්නා ගස්හි එම පරාග සමඟ පරාගනය වීම මත නීරෝගිමත් හා ඉහල නිෂ්පාදන විභයක් ඇති මවු ශාකයකින් වුවද හටගන්නා බීජ පොල්හි එම ජානමය විභවය නොපැවතිය හැකිය.

එම තත්වය සැලකිල්ලට ගනිමින් හලාවත වැවිලි සමාගම, පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් සමග එක්ව පළගස්වැව වත්තෙහි තෝරා ගන්නා ලද මවු ශාක සමග අත්පරාගන වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. එහිදී පොල් පර්යේෂණ ආයතනයෙන් රැගෙන එනු ලබන සැන්රාමන් පරාග සමග උස පොල් ප්‍රභේදය මුහුම් කිරීම තුලින් ඉහල නිෂ්පාදනයක් ඇති, ජල හිගයට ප්‍රතිරෝධී, ඉහල කොප්පාරා ප්‍රමාණයක් හා වැඩි තෙල් ප්‍රතිශතයක් ඇති ප්‍රභේදයක් බිහි කරයි.

### කිණියම "කප්රුවන" බීජ පොල් උයන

වර්ෂ 2012 දී පොල් පර්යේෂණ ආයතනය හා හලාවත වැවිලි සමාගම ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමකට අනුව කිණියම "කප්රුවන" බීජ පොල් උයන ස්ථාපිත කර ඇත. එතුළින් ජානමය වැඩි දියුණු වූ "කප්රුවන" ප්‍රභේදයේ පොල් පැළ නිෂ්පාදනය කිරීමට නියමිතය.





## අගය එකතු කළ නිෂ්පාදන

### කජු පිරිසැකසුම

හලාවත වැවිලි සමාගම සතු කජු වගා ප්‍රමාණයෙන් බහුතරයක්ම පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම හා මංගලඑළිය වතු මූලික කරගනිමින් ව්‍යාප්තව ඇත. එහි හෙක්ටයාර් 827.63 ක පමණ ප්‍රමාණයක් දක්නට ලැබෙන අතර 2017 වර්ෂයේදී කජු කිලෝ ග්‍රෑම් 34,289 ක් ලබා ගැනීමට සමත් විය.

ලබා ගන්නා අස්වනු ප්‍රමාණයෙන් කොටසක් පලුගස්වැව වත්ත තුළ ඇති පිරිසැකසුම් මධ්‍යස්ථානයේදී අගය එකතු කරන ලද නිෂ්පාදන බවට පත්කර පාරිභෝගිකයින් වෙත නිකුත් කරනු ලබයි.






### පොල් තෙල්

පලුගස්වැව වත්ත තුළ නිෂ්පාදිත ගුණාත්මක කොප්පරා භාවිතයෙන් පොල් තෙල් නිෂ්පාදන කටයුතු පළමු වරට වර්ෂ 2012 දී ආරම්භ කරනු ලැබීය. එතුළින් අපේක්ෂා කරනුයේ සහනදායි මිල ගණන් යටතේ පාරිභෝගිකයින් හට අවර්ණ කරන ලද හා අයනීකරණයට භාජනය කරමින් පිරිපහදු කරන ලද පොල් තෙල් වෙනුවට හා අඩු මිල ගණන් මත ඇති එළවළු තෙල් වෙනුවට උසස් ගුණාත්මයෙන් යුතු පිරිසිදු පොල් තෙල් ලබා දීම වේ.



### මහා භාණ්ඩාගාරය වෙත ඉහළ ලාභාංශ ගෙවීම

හලාවත වැවිලි සමාගම ප්‍රාදේශීය වැවිලි සමාගම් අතුරින් විශිෂ්ඨ වැවිලි සමාගමක් ලෙස මහා භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 457 ක මුදලක් (වර්ෂ 1992 සිට 2016 දක්වා) ලාභාංශ ලෙස ලබා දීම මෙන්ම භාවිතා කරන්නාවූ ඉඩම් සඳහා බදු කුලිය ලෙස ද රුපියල් මිලියන 411 ක් පමණ මහා භාණ්ඩාගාරය වෙත සේවකයින්ගේ ව්‍යවස්ථාපිත ගෙවීම් (ඊ.පී.එෆ්/ඊ.ටී.එෆ්/පාරිතෝෂික) සහිතව ලබා දීමද සිදුකර ඇත.



## අපගේ සාමාජීය අවස්ථාවන්



හලාවත වැවිලි සමාගමෙහි 25 වැනි සංවත්සරය සැමරීම



25 වැනි සංවත්සරයට අදාලව
පොල් කොහු මෝල නැවත ආරම්භ කිරීම හා
එතුළින් නව රැකී රක්ෂා ජනිත කිරීම



සමාගමෙහි සභාපතිතුමන් MASCO
සම්මානයෙන් පිදුම් ලැබීම



කාර්ය සාධන ඇගයීම් පිළිබඳව පැවැත්වූ වැඩසටහන



25 වැනි සංවත්සරය නිමිත්තෙන්
පොල් පැළ සිටුවීමේ වැඩසටහන



ගාල්ල, මාතර හා රත්නපුර දිස්ත්‍රික්ක වල ගං වතුරෙන් හා
නාය යාමෙන් අවතැන්වූවන් සඳහා අධාර දීමේ වැඩ සටහන



සමාගමෙහි නිෂ්පාදන කොළඹ ජාත්‍යන්තර
වෙළඳ ප්‍රදර්ශණයේ අලෙවියට තබමින්



සහනදායි මිල යටතේ පාරිභෝගිකයින්ට හා
ලංකා සතොස වෙත පොල් නිකුත් කිරීම

## තිරසාරත්වය

### තිරසාරත්වය පිළිබඳ සමාලෝචනය

වැවිලි සමාගමක් වශයෙන් ඇති ජෛවීය සම්පත් නොනැසී පවත්වා ගනිමින් ඵලදායීව හැසිරවීම තිරසාරත්වය ලෙස අපට හැඳින්විය හැක. පරිසර සංරක්ෂණය, සමාජීය වගකීම් හා ආර්ථික ප්‍රතිපත්ති මෙහි උදාර අරමුණු වේ. එම අරමුණු එක ලෙස සාමූහිකව හැසිරවීම මත සමාගමේ භෞතික, ආර්ථිකමය හා සමාජීයව තිරසාරත්වය ගොඩනැගෙනු ඇත. හලාවත වැවිලි සමාගම කෘෂිකාර්මික පරිසරයක් පදනම්ව ගොඩනැගී ඇති බැවින් පාරිසරික තුලනය හා පරිසර පද්ධති සංරක්ෂණය කෙරෙහි මූලිකත්වය ලබා දී ඇත.

පරිසර පද්ධති සංරක්ෂණය කරමින් ගොඩනැගෙන්නා වූ ආර්ථික ප්‍රතිලාභයන් අන්‍යෝන්‍ය සමාජීය බැඳීම මත හලාවත වැවිලි සමාගමෙහි වතු ආශ්‍රිතව වෙසෙන බොහෝ සාමාජිකයින් හට එම ප්‍රතිලාභ අත්කර දීමට අප සමාගම සමත් වී ඇත.

### තිරසර කෘෂිකර්මය

ඉඩම් හෙක්ටයාර් 5,733.23 ක් හලාවත වැවිලි සමාගමෙහි පරිපාලනයට යටත්ව පාලනය වන අතර, එහිදී ප්‍රධාන වගාව ලෙසට ස්ථාපිතව ඇති පොල් වගාව තුල ජෛවීය සම්පත් විවිධාංගීකරණය කිරීම තුලින් භූමිය උපරිම ලෙස පරිහරණය කිරීමට අප සමාගම සමත් වී ඇත. එහිදී පොල් යටි වගාවන් ස්ථාපිත කිරීම, අතුරු බෝග වගා කිරීම, සත්ව පාලනය සිදු කිරීම වැනි දෑ සඳහා ප්‍රමුඛස්ථානය ලබා දී ඇත. හලාවත වැවිලි සමාගම වර්ෂ 2008 දී රජයට පවරාගන්නා විට 6% ක් ලෙස පැවති ඵලදරන වගාවේ පොල් යටි වගාවන් අනුපාතය වර්ෂ 2017 වන විට 25% ක් දක්වා වැඩිකර ලීමට අප සමාගම සමත් වු අතර මෙම වගාවන් ඵලදරන අවධියට පැමිණීමත් සමඟ ඉදිරි වර්ෂ 08 ක් වැනි කාලයක් තුලදී හලාවත වැවිලි සමාගමෙහි වාර්ෂික පොල් අස්වැන්න පවත්නා අස්වැන්නට වඩා 30 % ක පමණ වැඩිවීමක් අපේක්ෂා කරන අතර, යටි වගාවන් ස්ථාපිත කිරීම මත වගා අක්කරයක පොල් ගස් ගහණය 138 ක් ලෙස සටහන් වැඩි වී ඇත.

තවදුරටත් පොල් යටි වගාවන් හා නව වගාවන් ස්ථාපිත කිරීමට සුදුසු ඉඩම් හදුනාගනිමින් සිටින අතර, ඒ සඳහා ආයෝජනය කිරීම සුදුසු ආර්ථික වත්කමක් හලාවත වැවිලි සමාගම පෙන්වා තිබීම අප ලැබූ සුවිශේෂි ජයග්‍රහණයක් වේ. සත්ව පාලනය ව්‍යාප්ත කිරීම, අහිතකර කාලගුණික තත්වය මත හානි වන පැළ නැවත සිටුවීම, නයිට්‍රජන් තිරකාරක ශාක සිටුවීම වැනි කාරණා මත ජෛව ගහණය වැඩි කරමින් සුවිශේෂි පරිසරයක් අඛණ්ඩව ගොඩනැගීම මත ඒකක නිෂ්පාදන පිරිවැය ද අවමකර ගැනීමට අප කටයුතු කර ඇත.

### පාංශු ජෛවීය ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම

තිරසර පරිසරයක් ගොඩනැගීමෙහිලා රසායනික පොහොර සඳහා කාබනික පොහොර ආදේශ කරමින් කාබනික පොල් වගාවන් පාලනය, පාංශු වයනය හා ව්‍යුහය ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමෙහිලා සත්ව කසල පැළ වගාවන් වෙත යෙදීම, ජල සංරක්ෂණ ක්‍රමෝපායන් අනුගමනය කිරීම, ජල සංචායක ස්ථාපිත කිරීම මත මතුපිට ජලය සංරක්ෂණය, ආවරන බෝග මගින් පසෙහි කාබනික ජෛව ස්කන්ධය වැඩි කිරීම, ග්ලිරිසීඩියා වැනි ශාක මගින් වායුගෝලීය නයිට්‍රජන් තිර කිරීම වැනි දෑ තුලින්ද ඉඩම්හි ඵලදායිතාවය හා එහි තිරසාරත්වය තහවුරු කර ඇත.

රාජ්‍ය ප්‍රතිපත්තීන්ට ගරුකරමින් හා අනුගත වෙමින් ජෛව හායනය නොවන බැරලෝහ අඩංගු කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට අප මෑත කාලයේදී සමත් වී ඇත. විශේෂයෙන් අහිතකර වල් නාශක, කෘමි නාශක භාවිතය හැකිතාක් අවමකර ඇත. පාරිසරික අහිතකර, පරිසර තුලනය බිඳහෙලන රසායනික ක්‍රමෝපායන් වෙනුවට සමාජීයව පිළිගත් ක්‍රමෝපායන් ලෙස,

1. වල් නාශක භාවිතය වෙනුවට ක්‍රමාණුකූලව සිදුකරන යාන්ත්‍රික වල් මර්ධනය, වගා ක්ෂේත්‍රය සී සෑම, පියුරේරියා වැනි ආවරණ බෝග ව්‍යාප්ත කිරීම හා ක්ෂේත්‍රය තුල සත්ව පාලනය සිදු කිරීම,
2. පොල් වගාවේ රතු කුරුමිණි හානිය වෙනුවෙන් පෙරමෝන උගුල් ක්ෂේත්‍රයේ තැබීම හා ආකර්ෂණය අවම කරන ක්‍රම අනුගමනය කිරීම,
3. ශෛෂ්‍ය විද්‍යාත්මක ක්‍රම මගින් වගා ක්ෂේත්‍රය පිරිසිදුව තබා ගැනීම,
4. පොල් මයිටා පාලනය වෙනුවෙන් විලෝපීය මයිටාවන් හානිය උග්‍රව ඇති හඳුනාගන්නා ක්ෂේත්‍රයන් වෙත පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයන් මත ක්‍රමාණුකූලව නිකුත් කිරීම, වැනි දෑ දැක්විය හැකිය.

### කාබනික ද්‍රව්‍ය පොහොර ලෙස භාවිතය හා චක්‍රීකරණය

පෝෂක ඌණතාවයන් සඳහා සිදුකරන එකම ආදේශකය ලෙස ඍජුවම රසායනික පොහොර යෙදීම වෙනුවට රසායනික පොහොර සමග කාබනික පොහොර යෙදීමද හලාවත වැවිලි සමාගම වර්තමානයේදී සිදුකරන ක්‍රියාවකි. එතුලින් යම්තාක් දුරට පසෙහි ජෛවීය සාධක නොනැසී පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත. හලාවත වැවිලි සමාගමෙහි පළුගස්වැව වත්ත තුල සිටින මී ගවයින්ගේ කසල එම වත්තේම පොල් පැළ සඳහා කාබනික පොහොර ලෙසද, හලාවත වතු සමූහයේ මාවතගම වත්තේ ඇති මී ගවයින්ගේ කසල එම වත්තේ කාබනික පොල් වගාව නඩත්තු කිරීමටද, කිණියම වත්ත, ආඩිගෙදර වත්ත හා

හීම්මැලියාගාර වතු වල සිටින බැටළුවන්ගේ කසල එම වතු වල ඇති පොල් පැළ වගාවන් වෙත රසායනික පොහොර වලට අමතරව ක්‍රමානුකූලව යෙදීම කරනු ලැබේ.

රසායනික පොහොර සමග කාබනික ද්‍රව්‍ය එක් කිරීම තුලින් පාංශු වයනය දියුණු වීම මත හා පාංශු තෙතමනය සංරක්ෂණය වීම මත පෝෂක ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් පසෙහි අභ්‍යන්තරයට කාන්දුවීම වලක්වා මතුපිට රඳාව ගැනීමට සමත්වේ. එමගින් සිදුකරන ආයෝජනය වඩාත් ඵලදායි වේ. විශේෂයෙන් පොල් ශාකය අඛණ්ඩ නිෂ්පාදනයක් සහිත වර්ධනයක් පෙන්නුම්කරනු ලැබීම මත පාංශු පෝෂක විශාල ප්‍රමාණයක් එම ක්‍රියාවලිය වෙනුවෙන් අවශෝෂණය කරනු ලැබේ. එම අවශෝෂණය කරනු ලබන පෝෂක නැවත එම ශාකයටම ලබාදීම වස් වියලී වැටෙන්නා වූ පොල් අතු වසුන් ලෙස යෙදීම හා පොල් ලෙලි වසුන් ලෙස හා පොල් ලෙලි වලවල් ලෙස වගා ක්ෂේත්‍රයේ තැන්පත් කිරීම කරනු ලැබේ. 2017 වර්ෂයට අදාලව පහත පරිදි එම වසුන් යෙදීම හා පොල් ලෙලි වැලලීම කර ඇත.

| වතු කලාපය | පොල් අතු වසුන් යෙදීම (ගස්) | පොල් ලෙලි වසුන් යෙදීම (ගස්) | පොල් ලෙලි වැලලීම (වලවල්) |
|---|---|---|---|
| හලාවත | 76,011 | 6,433 | 2,691 |
| බිංගිරිය | 99,069 | 8,957 | - |
| දිවුලපිටිය | 73,176 | 6,344 | 2,000 |
| මාදම්පේ | 70,440 | 2,645 | 1,600 |
| පළුගස්වැව | 83,568 | 4,745 | 4,246 |
| තම්බපණ්නි | 77,063 | 3,800 | 3,000 |
| මුළු එකතුව | **479,327** | **32,924** | **13,537** |

## ජෛව පද්ධති සංරක්ෂණය

හලාවත වැවිලි සමාගම සතුව සංරක්ෂණය කරනු ලබන ජෛව සම්පතක් ලෙස අක්කර 50 ක පමණ වපසරියක් ඇති මාවතගම වන ලැහැබ, අක්කර 10 කින් පමණ සමන්විත ගල්කන්ද වන ලැහැබ දැක්විය හැකිය. මෙම වන පද්ධති තෙත් කලාපීය පරිසර පද්ධතියක ස්වරූපයක් පෙන්නුම්කරන අතර, එය දීර්ඝ කාලයක සිට ජෛව විවිධත්වය සංරක්ෂණය උදෙසා ආරක්ෂා කරමින් සිටින අතර, එය තිරසර ඉඩම් කළමනාකරණය මනාවට පෙන්නුම්කරනු ලැබේ.

## දැවමය වගාව කළමනාකරණය

හලාවත වැවිලි සමාගම වතු ඒකක 85 කින් සමන්විත අතර, එම සමස්ත වතු ඒකකයන් තුල විවිධ විශේෂයන්ට හා වර්ධන අවධීන්ට යටත් දැවමය ගස් 21,533 ට වැඩි ප්‍රමාණයක් ඇත. බොහෝ වගාවන් වතු මායිම් අවට ඇතත් කාලයත් සමග දැව වගාව වතු අභ්‍යන්තරයට වැඩී ඇති ස්ථානයන් හදුනාගෙන ඇත. එවැනි ස්ථාන දැවමය වගාවන් සහිත භූමීන් ලෙස හදුනාගනිමින් කළමනාකරණය කරන අතර, කාලානුරූපීව ගස් වල වර්ධනයත් සමග නිසි අවසරයන් හා සැලැස්මක් මත හෙලීම කරනු ලැබේ. ඊට අමතරව කාසමඩු වත්ත, තම්බපණ්නි වත්ත වැනි වතු වල තේක්ක ගහනය වැඩි කිරීමෙහිලා තේක්ක වගාව හෙක්ටයාර් 12 ක නැවත ආරම්භ කිරීමටද අප සමත් වී ඇත. එමෙන්ම හලාවත වැවිලි සමාගම සඳහා පස් අවුරුදු වන කළමනාකරණ සැලැස්මක් සැකසීම කෙරෙහිද අපගේ අවධානය යොමු වී ඇති බවත් සතුටින් දැක්විය හැකිය.

## තිරසර නිෂ්පාදන

හලාවත වැවිලි සමාගම විසින් වර්තමානය වන විට අගය එකතුකරන ලද භාණ්ඩ අලෙවිය පිළිබඳව වැඩි අවධානයක් යොමු කොට ඇත. එහිදී අවර්ණ කරන ලද හෝ පිරිපහදු කරන ලද පොල් තෙල් හෝ එළවළු තෙල් වෙනුවට පළුගස්වැව උසස් කොප්පරා මගින් නිෂ්පාදිත "පළුගස්වැව නැඹුල් පොල් තෙල්" හා පිරිසැකසුම් කරන ලද "තම්බපණ්නි කජු" දැක්විය හැකිය. මෙතුලින් උසස් තත්වයේ නිෂ්පාදන පාරිභෝජනය කිරීමේ හැකියාව රටෙහි මහජනතාව වෙත අප විසින් උදාකර දී ඇත. තවදුරටත් වෙළෙඳ ප්‍රජාව වෙත අපගේ නිෂ්පාදන සමීප කරවීම උදෙසා විවිධ ආයතන වල සුහසාධක සංගම් මගින් බෙදා හැරීම හා කොළඹ අලෙවි කුටිය මගින් අලෙවි කිරීම කරනු ලබයි. ඒ මගින් මහජනතාව නිෂ්පාදන සඳහා වැය කරන්නා වූ මුදලට උසස් ගුණාත්මයකින් යුතු නිෂ්පාදන බෙදා හැරීම අපගේ අරමුණ වේ.

## කාබන් පිය සටහන

හලාවත වැවිලි සමාගමෙහි සෘජු හා වක්‍රාකාර ක්‍රියාකාරිත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස කාබන් ඩයොක්සයිඩ් හෝ ඒ හා සමාන ඒකකයන්ගේ නිෂ්පාදනය අවම කිරීමෙහිලා අරමුණු කරමින් කටයුතු යොදන බව දැක්වීමට කැමැත්තෙමු. අවම කාර්යක්ෂමතාවයක් ඇති යන්ත්‍රෝපකරණ වෙනුවට කාර්යක්ෂමතාවය ඉහල නව යන්ත්‍රෝපකරණ ලබා දීම, අනවශ්‍ය පරිදි රථ වාහන ධාවනය නොකිරීම, වියෝජණය වන කාබනික ද්‍රව්‍ය නැවත

පසට ප්‍රතිචක්‍රීකරණය වීමට ඉඩ හැරීම, සේවකයින්ගේ ආකල්ප හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම මත ඒකක ඵලදායිතාවය වැඩි කිරීම හා ඒ සඳහා වැයකරනු ලබන සම්පත් භාවිතය අවම කිරීම වැනි දෑ තුලින් හලාවත වැවිලි සමාගම සාමූහිකව කාබන් පියසටහන අවම කිරීමට දායක වී ඇත.

## සේවක හා සමාජීය සම්බන්ධතා

### සේවක ප්‍රතිලාභ

හලාවත වැවිලි සමාගම සෑම විටම සේවකයින්ගේ ආකල්ප ඉහල නංවා ඔවුන්ට අත්කර දෙනු ලබන ප්‍රතිලාභ කෙරෙහි වඩාත් උනන්දුවෙන් පසුවන ආයතනයක් ලෙස හැඳින්විය හැකිය. ආයතනයක වටිනාම සම්පත මානව සම්පත ලෙස හඳුනාගනිමින් කාර්ය්‍ය සාධනය මත පදනම්ව වාර්ෂිකව බොහෝ සුභසාධක කටයුතු වල නියැලී සිටී. එලෙස සමාගමේ සේවකයින් හට හිමිවන ප්‍රතිලාභ ලෙස,

- දිරි දීමනා වශයෙන් 2017 වර්ෂයේදී රුපියල් මිලියන 15.10 ක් ගෙවීම,
- ලාභාංශ වශයෙන් රුපියල් මිලියන 11.10 ක් ගෙවීම,
- පාරිභෝජනය වෙනුවෙන් මාසිකව ආසන්න රුපියලක නාමික මිලකට පොල් නිකුත් කිරීම,
- සියළුම සේවකයින් රක්ෂණය කිරීම හා රක්ෂණ වන්දි ගෙවීම,
- අඩුපොළී අනුපාත යටතේ ආපදා ණය ලබාදීම,
- කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා වාර්ෂික සුහඳ හමුවක් පැවැත්වීම,
- වාර්ෂික විනෝද චාරිකව සඳහා අනුග්‍රහය ලබා දීම,

මෙය මානව සම්පත් කළමනාකරණ උපයාමාර්ග සේවක අභිප්‍රේරණය සඳහා විශාල වශයෙන් දායක වී ඇති අතර, සමාගමේ ඵලදායිතාවය ඉහළ නැංවීම හා සමාගම කෙරෙහි ඇති බැඳියාව වර්ධනය වීම කෙරෙහි හේතු වී ඇත.

### වතු යටිතල පහසුකම් දියුණු කිරීම

සෑම විටම සේවකයින්හට යහපත් සෞඛ්‍ය තත්වයක් මත සේවය කිරීමට සුදුසු පරිසරයක් ගොඩනැගීමෙහිලා හලාවත වැවිලි සමාගම කැප වන අතර, විශේෂයෙන් වතු සේවකයින් හට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත. එය පහත පරිදි දැක්විය හැක.

| අයිතමය | වැයකර ඇති මුදල (රු.මිලියන) |
|---|---|
| 1. වතු නිල නිවාස හා කම්කරු නිවාස අලුත්වැඩියාවට හා නඩත්තුව | 7.80 |
| 2. මාර්ග පිළිසකර කිරීම | 0.88 |
| 3. ජල සම්පාදන කටයුතු | 2.54 |
| 4. අනෙකුත් සුභසාධක කටයුතු | 7.50 |

### සමාජීය වගකීම්

හලාවත වැවිලි සමාගම නිරන්තරයෙන් බාහිර පාර්ෂව සමග සහජීවන සම්බන්ධතා ගොඩනගමින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබයි. සමාගම සතු සම්පත් සමාජීය සුභ සිද්ධිය උදෙසා තම ජීවන තත්වය ගොඩනංවා ගැනීම වෙනුවෙන් පරිහරනය කිරීමට අවස්ථාව ලබා දී ඇත. සමාගම සතු ඉඩම් බොහොමයක් සඳහා වතු අවට සිටින අඩු ජීවන තත්වයක් පෙන්නුම් කරනු ලබන ගොවීන්ට අයත් කිරි ගවයින්ට අවශ්‍ය තණකොළ උලාකෑමට අවස්ථාව ලබා දී ඇත. එතුලින් ඔවුන්ගේ ජීවන තත්වය ඉහල යාමත් සමග රටෙහි සමස්ථ කිරි නිෂ්පාදනය ඉහල නැංවීමට අප දායක වෙමින් පවතී. සතුන්ගේ උලාකෑම තුලින් වල් මර්දනය වීම, මළ ද්‍රව්‍ය එක් වීම හේතුවෙන් පසෙහි කාබනික සංයුතිය වැඩි වීම වැනි ප්‍රයෝජනවත් දෑ වක්‍රාකාරව සමාගමට වාසි ලෙසට අත් වේ.

අමතරව වාර්ෂිකව වෙහෙර විහාර, සිද්ධස්ථාන මගින් ඉල්ලුම්කරනු ලබන බොහෝ පහසුකම් අප සම්පාදනය කරන අතර, එහිදී අවශ්‍ය කටයුතු වෙනුවෙන් දැවමය ගස් ලබාදීම, මූල්‍යාධාර ලබා දීම, විවිධ පන්සල් හා දේවාල පෙරහැර වෙනුවෙන් කොප්පරා ලබා දීම මගින් ඒ සඳහා සමාගම අනුග්‍රාහකත්වය ලබාදීම මෙන්ම රටෙහි ඇතිවන්නා වූ ව්‍යසනයන්හී දී ඒ සඳහා ක්‍රියාකාරීව සහන සැලසීම වෙනුවෙන් කටයුතු කරනු ලබයි.

වැවිලි සමාගමක් ලෙස අප පාරිසරික, සමාජීයව හා ආර්ථික සංතුලනය තුලින් තිරසර සංවර්ධනයක් අත්කර ගැනීම, ආර්ථිකමය ඵලදායි කෘෂිකාර්මික කටයුතු වල නියැලෙමින් සමස්ථ සේවකයින්ගේ අභිප්‍රායන් ඉෂ්ඨ කරමින් රටෙහි සංවර්ධනයේ කොටස්කරුවෙකු වශයෙන් දායක වීමට හලාවත වැවිලි සමාගම කෘෂි ව්‍යාපාර සමාගමක් ලෙස අදිටන්කර ගෙන ඇත.


Plant the Future...

## සමාගමේ මූල්‍ය ප්‍රගතිය ලුහුඬින්

| අයිතමය | 2017 රු.මි. | 2016 රු.මි. | විචලනය (2016-2017) | | |
|---|---|---|---|---|---|
| | | | රු.මි. | % | ප්‍රධාන සාධකය |
| අයභාරය | 516 | 383 | 133 | 35 | පොල් ගෙඩියක ශුද්ධ විකුණුම් සාමාන්‍ය (NSA) වැඩිවීම හා ඉහළ ආරම්භක තොගය වර්ෂය තුලදී අලෙවි වීම. |
| විකුණුම් පිරිවැය | 311 | 234 | 77 | 33 | ඉහල ආරම්භක තොගයක් සහ අඩු අවසන් තොගයක් ගැලපීම. |
| අනෙකුත් ආදායම් | 59 | 66 | (7) | (11) | පශු සම්පත් ව්‍යාපෘතියේ ලාභය පහත වැටීම. |
| පරිපාලන වියදම් | 111 | 103 | 8 | 8 | සේවක වැටුප් හා අනෙකුත් පරිපාලන වියදම් ඉහලයාම. |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 12 | 9 | 3 | 33 | 10% සේවක ලාභ කොටස් ඉහළයාම. |
| මූල්‍ය ආදායම් | 18 | 14 | 4 | 29 | ස්ථාවර තැම්පත් වල ආයෝජනය ඉහළයාම හා පොළී අනුපාතය ඉහළයාම. |
| මූල්‍ය පිරිවැය | 34 | 33 | 1 | 3 | දළ දේශීය නිෂ්පාදන අවධමනකයේ වෙනස්වීම හේතු කොටගෙන කල් බදු බදු පොළී වැඩිවීම. |

### අයභාරය

2017 සමාලෝචිත වර්ෂය තුලදී සමාගම රුපියල් මිලියන 516 ක අයභාරයක් වාර්ථා කර ඇති අතර 2016 වර්ෂයේ වාර්ථා වූ රුපියල් මිලියන 383 ක අයභාරය සමඟ සංසංදනාත්මකව ගත්කල එය රුපියල් මිලියන 133 ක වැඩිවීමකි.(35%ක වැඩිවීමකි.) 2016 වර්ෂයේ පැවති පොල් ගෙඩියක සාමාන්‍ය විකුණුම් මිල රුපියල් 25/- සිට 2017 වර්ෂයේදී රුපියල් 42/- දක්වා ඉහල යාමත් ඉහල වටිනාකමකින් පැවති වර්ෂයේ ආරම්භක පොල් තොගය වර්ෂය තුල උපලබ්ධි වීමත් යන කරුණු අයභාරයේ වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

කෙසේ වෙතත් 2017 වර්ෂයේ පොල් අස්වැන්න 2016 වර්ෂයේ පැවති පොල් ගෙඩි 16,522,290 සිට පොල් ගෙඩි 11,651,155 දක්වා 29%කින් අඩු වී ඇත. 2016 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වාත් ජුනි සිට දෙසැම්බර් දක්වා හා 2017 වර්ෂයේ පැවති වියලි හා අසාමාන්‍ය උෂ්ණ කාලගුණික තත්වය මෙම පොල් අස්වැන්නෙහි අඩුවීම කෙරෙහි බලපා ඇත.










### විකුණුම් පිරිවැය.

2017 වර්ෂයේ විකුණුම් පිරිවැය රුපියල් මිලියන 311 ක් වූ අතර, 2016 වර්ෂයේ එය රුපියල් මිලියන 234 ක් විය.රුපියල් මිලියන 77 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

| | 2017 | 2016 |
|---|---|---|
| **නිෂ්පාදන පිරිවැය රුපියල් (මිලි.)** | **288** | **268** |
| + ආරම්භක තොගය රුපියල් (මිලි.) | 56 | 22 |
| - අවසන් තොගය රුපියල් (මිලි.) | (33) | (56) |
| **විකුණුම් පිරිවැය රුපියල් (මිලි.)** | **311** | **234** |

- සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 288 වූ අතර, එය 2016 වර්ෂයේ පැවති රුපියල් මිලියන 268 ට සාපේක්ෂව රුපියල් මිලියන 20 ක වැඩිවීමකි.ඒ සඳහා බලපා ඇති ප්‍රධාන හේතු අතර, වතු සේවක නව සාමූහික ගිවිසුමට අනුව වතු විධායක නොවන නිලධාරී හා කළමනාකරණ සේවා චක්‍රලේඛ වලට අනුව වතු විධායක නිලධාරීන්ගේ වැටුප් ඉහල යාම නිසා පසුගිය වර්ෂයට සාපේක්ෂව වැටුප් ගෙවීම වෙනුවෙන් රුපියල් මිලියන 7.2 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවීම.
- එල දරණ පොල් වගාව වෙනුවෙන් පොහොර යෙදීම සඳහා 2016 වර්ෂයේ රු.මිලයන 19.4 ක් දරා ඇති අතර, 2017 වර්ෂයේදී එය රුපියල් මිලියන 35 ක් දක්වා වැඩිවී ඇත. 2016 වර්ෂයේ අවසන් කාර්තුව තුල පොහොර

යෙදීමට හිතකර කාලගුණ තත්වයක් නොපැවතීම හේතුවෙන් 2016 වර්ෂයේ පොහොර යෙදීම සීමිත වගා ප්‍රදේශයකට සීමා විය.

- ඉහත සාධක වලට අමතරව ඉහළ ආරම්භක තොග වටිනාකමක් හා අඩු අවසන් තොග වටිනාකමක් 2017 වර්ෂයේ විකුණුම් පිරිවැය ගණනය කිරීම සඳහා ගැලපීම හේතුවෙන් විකුණුම් පිරිවැය රුපියල් මිලියන 311 ක් දක්වා වැඩිවී ඇත.

## දල ලාභය

සමාලෝචිත වර්ෂයේ දල ලාභය 2016 වර්ෂයේ පැවති රුපියල් මිලියන 148.7 ට සාපේක්ෂව රුපියල් මිලියන 205.5 දක්වා 38% කින් වර්ධනය වී ඇත.

පොල් සඳහා දල ලාභ අනුපාතය 2016 වර්ෂයේ පැවති 39% සිට 40% දක්වා සමාලෝචිත වර්ෂයේදී වර්ධනය වී ඇත.







## අනෙකුත් මෙහෙයුම් ආදායම්

සමාගම කජු, පොල් ලෙලි, දැව ගස්, කුඹුරු, පශු සම්පත්, මැරුණු වැටුණු පොල් ගස් අලවියෙන් වැනි අනෙකුත් මෙහෙයුම් අදායම් මඟින් රුපියල් මිලියන 59.1 ක අදායමක් උපයා ඇත. පසුගිය වර්ෂයේ පැවති රුපියල් මිලියන 65.9 ට සාපේක්ෂව එය 10% ක අඩුවීමකි.

ජාතික පශු සම්පත් මණ්ඩලය මඟින් නිකුත් කරනු ලබන චක්‍ර ලේඛයට අනුව පශු සම්පත් අගය කිරීමේදී පශු සම්පත් වල අගය රුපියල් මිලියන 11.5 කින් අඩුවීම, කජු ව්‍යාපෘතියෙන් රුපියල් මිලියන 05 ක අලාභයක් වාර්ථාවීම අනෙකුත් මෙහෙයුම් ආදායම් අඩුවීමට හේතුවිය.

අනෙකුත් මෙහෙයුම් අදායම් ප්‍රභවයන්ට අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 20 යටතේ දක්වා ඇත.

## පරිපාලන හා අනෙකුත් මෙහෙයුම් වියදම්

කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව සේවක වැටුප් වැඩිවීම,ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා පිරිවැය ඉහල යාම, වාහන අලුත්වැඩියා පිරිවැය වැඩිවීම,සේවක සුභසාධක වියදම් ඉහළයාම හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් රුපියල් මිලියන 102.5 සිට රුපියල් මිලියන 110.6 දක්වා ඉහල ගොස් ඇත .

2017 වර්ෂයේ අනෙකුත් මෙහෙයුම් වියදම් රුපියල් මිලියන 12.3 වන අතර, 2016 වර්ෂයේ එය රුපියල් මිලියන 8.6 ක් විය. 10% සේවක ලාභ කොටස් ඉහල යාම හේතුවෙන් අනෙකුත් මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 3.6 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

## මූල්‍ය ආදායම

ප්‍රධාන වශයෙන් කෙටිකාලීන තැම්පතු මත උපයන ලද පොළී අදායමෙන් මූල්‍ය අදායම සමන්විත වන අතර, 2016 වර්ෂයේ උපයන ලද රුපියල් මිලියන 14 ක මූල්‍ය අදායම 2017 වර්ෂයේදී රුපියල් මිලියන 18.4 ක් දක්වා රුපියල් මිලියන 04 කින් වර්ධනය වී ඇත. පසුගිය වර්ෂයට සාපේක්ෂව පොළී අනුපාතය හා කෙටිකාලීන තැම්පතු වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන හේතු සාධක විය.

## මූල්‍ය පිරිවැය

2017 වර්ෂයේ මූල්‍ය පිරිවැය රුපියල් මිලියන 34 ක් වූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව එය 3% ක වැඩිවීමකි. දල දේශීය නිෂ්පාදන අවධමනකය (GDP Deflator) පදනම් කර ගනිමින් රජයේ කල් බදු පොළිය වාර්ෂිකව වැඩිවීම මීට හේතු වී ඇත.



### වර්ථන හා විලම්භිත බදු

2016 වර්ෂයේ බදු වියදම වන රුපියල් මිලියන 15.1 ට සාපේක්ෂව 2017 වර්ෂයේ සමාගම රුපියල් මිලියන 44.9 ක බදු වියදමක් දරා ඇත. එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 197% ක වැඩිවීමකි. ඉන් රුපියල් මිලියන 5.4 ක් වර්ථන අදායම් බදු ලෙස වර්ෂයේ දරා ඇත.

වර්ෂය සඳහා දරන ලද විලම්භිත බද්ද රුපියල් මිලියන 39.4 වූ අතර, එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 210% වැඩිවීමකි. බදු අනුපාතය ඉහළයාම මත මේරූ හා නොමේරූ වගා වල කාලින වෙනස විලම්භිත බදු ඉහල යාමට හේතුවිය.

සමාගමට අදාල බදු අනුපාතය හා සහනයන් පිළිබඳව මුල්‍ය වාර්ථා  වල සටහන් අංක 23 තුල ඇතුලත්ව ඇත.

### බදු පෙර ලාභය

සමාගමේ බදු පෙර ලාභය 2016 වර්ෂයේ පැවති රුපියල් මිලියන 84.8 ක සිට 2017 වර්ෂයේ දී රුපියල් මිලියන 126.4 ක් දක්වා රුපියල් මිලියන 42 කින් එනම් 49% වර්ධනය වී ඇත. 2017 වර්ෂයේ දී පැවති ඉහල පොල් මිල මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් පාදක විය.

### බදු පසු ලාභය

2016 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 69.6 ක බදු පසු ලාභයට සාපේක්ෂව 2017 වර්ෂයේ දී සමාගම රුපියල් මිලියන 81.4 ක බදු පසු ලාභයක් උපාය ඇත.




### පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ඉපයීම් (EBITDA)

සමාගමේ පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ඉපයීම් 2016 පැවති රුපියල් මිලියන 143 ක සිට රුපියල් මිලියන 176 ක් දක්වා 23% කින් වර්ධනය  වී ඇත.

### ලාභාංශ

බොහෝ රාජ්‍ය ආයතන රජයේ අරමුදල් මත යැපෙමින් සිටි.එහෙත් හලාවත වැවිලි සමාගම එහි කළමනාකාරිත්වය 2008 මැයි මස නැවත රජයට පවරා ගැනීමෙන් පසුව ස්වර්ණමය කොටස් හිමිකරු වන මහා භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 295 ක මුදලක් ලාභාංශ ලෙස ගෙවා ඇත. 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල උපයන ලද ලාභය සමඟ ගත්කල මෙය සැලකිය යුතු ඉහල වටිනාකමකි.එමෙන්ම 1992 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සැලකිල්ලට ගත් විට හලාවත වැවිලි සමාගම මහා භාණ්ඩාගාරය වෙත ගෙවා ඇති මුළු ලාභාංශ ප්‍රමාණය රුපියල් මිලියන 457 කි.

### මානව සම්පත් සේවාව අගය කිරීම

මානව සම්පත ආයතනයේ ඉතාම වැදගත් වත්කමක් වන බවට ඇති දැඩි විශ්වාසය හේතුවෙන් සමාගම සිය සේවකයින් දිරිමත් කිරීම සඳහා ගන්නා ලද පියවරක් ලෙස 2017 වර්ෂයේ දී රුපියල් මිලියන 15.1 ක් සේවකයින්ගේ කාර්ය සාධන දීමනා ලෙස ගෙවා ඇත. පසුගිය වර්ෂයේ එය රුපියල් මිලියන 14.5 ක් විය.

එයට අමතරව 2017 වර්ෂයේ දී රුපියල් මිලියන 11.1 ක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයේ (PMMD) 1995 වර්ෂයේ අනුමැතිය මත අකණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන මෙහෙයුම් ලාභය මත 10% ක සේවක ලාභ කොටස් ගෙවීම් කිරීම සඳහා 2017 වර්ෂයේ දී රුපියල් මිලියන 11.1 ක් වෙන්කිරීම් කර ඇත.

### කොටසක ඉපයීම (EPS)

මුල්‍ය වර්ෂය තුල සමාගමේ කොටසක ඉපයීම රුපියල් 4.07 ක් වූ අතර, එය පසු ගිය වර්ෂයේ පැවති රුපියල් 3.48 ට සාපේක්ෂව 17% ක වැඩිවීමකි.




### යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය (ROCE) සහ ස්කන්ධ ප්‍රතිලාභ අනුපාතය (ROE)

සමාලෝචිත වර්ෂයේ ලාභය ඉහල යාම හේතුවෙන් යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය (ROCE) 2016 පැවති 10% ක සිට 2017 වර්ෂයේදී 13% දක්වා වර්ධනය විය.

එමෙන්ම එම හේතුවෙන් ස්කන්ධ ප්‍රතිලාභ අනුපාතය ද 8% ක සිට 9% දක්වා ප්‍රවර්ථන වර්ෂයේ දී වර්ධනය විය.







## වත්කම් සමුදාය

2017 වර්ෂය අවසනට සමාගමේ වත්කම් සමුදාය රුපියල් මිලියන 1,356 ක් ලෙස වාර්ථා වී ඇති අතර, ඉන් 78% ජංගම නොවන වත්කම් හා 22% ක් ජංගම වත්කම් වලින් සමන්විත වේ. ප්‍රධාන වශයෙන් ධාරක ජීව වත්කම් වල වැඩිවීම හේතුවෙන් වර්ෂය තුලදී මුළු වත්කම් 6% කින් වැඩි වී ඇත. ධාරක ජීව වත්කම් ඵල දරන හා නොමේරූ පොල් වගාව, කජු වගාව, අනෙකුත් බහු වාර්ෂික වගාවන්ගෙන් හා පශු සම්පත් වලින් සමන්විත වේ.

| වත්කම් සමුදාය | 2017 රු.මිලි. | 2016 රු.මිලි. |
|---|---|---|
| ජනවසම හිස් භූමි වල කල් බදු හිමිකම | 74 | 76 |
| කල්බදු දේපල පිරියත උපකරණ (ජනවසම) | 1 | 1 |
| කල්බදු ධාරක ජීව වත්කම් (ජනවසම) | 24 | 27 |
| ධාරක ජීව වත්කම් / ( කල් බදු ජීව වත්කම් හැර) | 794 | 727 |
| පරිභෝජ්‍ය ජීව වත්කම් | 55 | 42 |
| නිදහස් දේපල පිරියත උපකරණ | 106 | 97 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 8 | 8 |
| ජංගම වත්කම් | 294 | 300 |
| **මුළු වත්කම්** | **1,356** | **1,278** |

සමාගමේ වත්කම් සමුදාය ප්‍රධාන වශයෙන් ධාරක ජීව වත්කම් වලින් සමන්විත වන අතර, එය මුළු වත්කම් වලින් 60% කි. පාරිභෝගික ජීව වත්කම් දැව ගස් වටිනාකමකින් සමන්විත වන අතර, එය මුළු වත්කම් වලින් 4% කි.

## ප්‍රාග්ධන වියදම්

සමාලෝචිත වර්ෂය තුල සමාගම රුපියල් මිලියන 115 ක් ප්‍රාග්ධන වියදම් ලෙස පොල් යටි වගා, නව වගා සහ දේපල පිරියත උපකරණ වෙනුවෙන් දරා ඇත. ඉන් රුපියල් මිලියන 82 ක් ( 2016 වර්ෂය තුල රුපියල් මිලියන 85) හෙක්ටයාර් 975 ක ඇති නව වගා, යටි වගා හා නොමේරූ වගා නඩත්තුව වෙනුවෙන් දරා ඇත.එය මුළු ප්‍රාග්ධන පිරිවැයෙන් 71% ක් වේ. වර්ෂය තුලදී රුපියල් මිලියන 02 ක් අතුරු බෝග වගා වෙනුවෙන් ද දේපල පිරියත උපකරණ වෙනුවෙන් රුපියල් මිලියන 31 ක් ද දරා ඇත. (2016 වර්ෂයේ රුපියල් මිලියන 17 කි.)

## ස්කන්ධය

ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 200 කින් හා සංචිත රුපියල් මිලියන 747.8 කින් ස්කන්ධය සමන්විත වේ. සංචිත වල සංයුතිය පහත පරිදි වේ.

| | 2017 | 2016 |
|---|---|---|
| රඳවා ගත් ඉපයීම් | 665.5 | 633.8 |
| දැව සංචිත | 82.3 | 61.8 |
| **මුළු සංචිත** | **747.8** | **695.6** |

## කොටස් හිමියන්ගේ අරමුදල් අනුපාතය

ප්‍රාග්ධන ව්‍යුහය තුල කොටස් හිමි අරමුදල 2016 වර්ෂයේ පැවති රුපියල් මිලියන 896 සිට රුපියල් මිලියන 948 දක්වා 6% කින් වර්ධනය වී ඇත. සමාලෝචිත වර්ෂය තුල කොටස් හිමියන්ගේ අරමුදල මුළු වත්කම් වලින් 70% කට සමානය.




## ද්‍රවශීලතා මට්ටම

| | 2017 | 2016 |
|---|---|---|
| මුළු ජංගම වත්කම් | 294 | 300 |
| මුළු ජංගම වගකීම් | 121 | 135 |
| ශුද්ධ කාරක ප්‍රාග්ධනය | 173 | 165 |
| ජංගම අනුපාතය | 2.4 | 2.2 |

ප්‍රධාන වශයෙන් කෙටි කාලීන ආයෝජන ඉහල යාම හා වෙළඳ හා අනෙකුත් ණය ගැතියන් අඩුවීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවති ශුද්ධ කාරක ප්‍රාග්ධනය රුපියල් මිලියන 165 සිට 2017 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 173 ක් දක්වා වර්ධනය වී ඇත.

### ජංගම අනුපාතය

පසුගිය වර්ෂයේ වාර 2.2 ක් වූ ජංගම අනුපාතය ප්‍රවර්ථන වර්ෂයේ දී 2.4 ලෙස වර්ධනයක් පෙන්නුම් කරයි.කෙටි කාලීන තැම්පතු ඉහල යාම හා වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ අඩුවීම ප්‍රධාන වශයෙන් මෙයට හේතු විය.

වර්ෂයේ ජංගම අනුපාතය වාර 2.4 ක් ලෙස පැවතීම සමාගමට කෙටි කාලීන ද්‍රවශීලතා අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට හැකි ප්‍රමාණවත් අර්ථාන්විත මට්ටමක් පෙන්නුම් කරයි.

### මුදල් ප්‍රවාහ

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 180 ක් වේ. පසුගිය වර්ෂයේ පැවති රුපියල් මිලියන 76 ට සාපේක්ෂව එය 136% ක වර්ධනයකි. ප්‍රවර්ථන වර්ෂය තුල සමාගම නොමේරූ වගා වෙනුවෙන් රුපියල් මිලියන 84 ක් ආයෝජනය කර ඇත. පසුගිය වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් දැරූ රුපියල් මිලියන 80 ක ශුද්ධ මුදල් ගලා යාමට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේ දී රුපියල් මිලියන 137 ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් දරා ඇත.

පසුගිය වර්ෂයේ වාර්ථා වූ රුපියල් මිලියන 02 ක මුදල් ගලා යාමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා යාම රුපියල් මිලියන 32 කි. මහා භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 30 ක ලාභාංශ මුදලක් ගෙවීම මූල්‍ය ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ගලායාම ඉහල යාමට බලපෑ ප්‍රධාන සාධකය විය.

සමස්ථයක් වශයෙන් පසුගිය වර්ෂයේ වාර්ථා වූ ශුද්ධ මුදල් ගලායාම වන රුපියල් මිලියන 06 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල දී සමාගමේ මුදල් හා මුදල් සමාන දෑ සඳහා වූ ශුද්ධ බලපෑම රුපියල් මිලියන 12ක ශුද්ධ මුදල් ගලා ඒමකි.




වතු වලින් අස්වැන්න සඳහා දායකත්වය වර්ෂ 2017

| වත්ත | අස්වැන්න ගෙඩි වලින් |
|---|---|
| හලාවත | 1,448,428 |
| පලුගස්වැව | 3,943,764 |
| තම්බපණ්ණි | 1,747,153 |
| බිංගිරිය | 1,956,301 |
| දිවුලපිටිය | 1,207,989 |
| මාදම්පේ | 1,347,520 |
| **එකතුව** | 11,651,155 |

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියාකරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා හේතු වි ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම වැඩිවන අයුරින් සකස් කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියා පටිපාටින්, ක්‍රියා පිලිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වි ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යය සාධනය සඳහා වගකීව යුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින්නේය.

### වගකීම්

මුලික ප්‍රතිපත්තීන් හා උපායශීලි අරමුණ සකස් කිරීමටත් එවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටි. සමාගමේ මූල්‍ය තොරතුරු වල විශ්වාසනියත්වය සහ අභ්‍යන්තරික පාලන ක්‍රමවේදයන්ගේ සාර්ථකත්වය සදහා ද අවසාන වගකීම් දරන්නාවන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

### සංයුතිය

සභාපති සහ විධායක අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය 2017 වර්ෂයේ අධ්‍යක්ෂවරුන් හත්දෙනෙකුගෙන් සමන්විත වේ.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අයවැය, සියලු කාර්යයන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා ප්‍රවර්ධන වියදම් සමාලෝචනයට ලක් කිරිම මෙම රැස්වීමේදි සිදුවේ. සෑම රැස්වීමක් පැවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2017 වර්ෂය තුලදි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 13 ක් පවත්වා ඇත.

### විගණන කමිටුව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් යුක්තය.

විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන පි.බි.එස්.සි. නොනිස් මහතා විගණන කමිටුවේ සභාපතිත්වය උසුලන අතර වර්ෂය තුල ඇගයීම් 05 ක් සිදුකර ඇත.

විගණකාධිපති දෙපාර්ථමේන්තුවේ නිලධාරියකු නිරික්ෂකයෙකු වශයෙන් විගණන කමිටු රැස්වීම් වලට සහභාගි වි ඇත.

සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි, විධායක අධ්‍යක්ෂක, සහකාර සමාන්‍යාධිකාරි වැවිලි, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි විමසීම් කරන අවස්ථා වලදි මෙම කමිටු රැස්වීම් වලට සහභාගි වේ.

### නීතිමය අවශ්‍යතාවලට අනුකූලවීම

සාංගමික සංස්ථා පත්‍රය, සංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත් වන අනෙකුත් නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම ගනු ලබන බවට සහතික වේ. එමෙන්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රි ලංකා ගිණුම් කරන ප්‍රමිතින්ට අනුකූල වන පරිදි පිළියෙල කරන බවටත් 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරනු ලබයි.

# අවදානම් කළමනාකරණය

විශේෂයෙන් කෘෂි ක්ෂේත්‍රයේ පවතින සමාගමක් ලෙස පරිසරය තුල විකාශය වීම හා විවිධ මට්ටමේ අවදානම් කෙරෙහි නිරාවරණය වී ඇති අතර කාළගුණ රටාව හා වෙළඳපළ උච්චාවචනයන් කෙරෙහි ඉහළ සංවේදි බවක් දක්වයි. අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුලින් දැනුවත්ව හා දූරදර්ශීභාවයෙන් අවදානම් දැරීම කෙරෙහි සහතික වීම බලාපොරොත්තු වේ.

## අවදානම් පාලන ක්‍රමෝපායන්

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන් |
|---|---|---|
| දේශගුණික වෙනස්වීම් | මාස ගණනක් අඛණ්ඩව පවතින අනපේක්ෂිත නියඟ වැනි අයහපත් කාළගුණික තත්වයන් නිසා පොල්, කජු සහ අනෙකුත් බහු වාර්ෂික බෝග වල අස්වැන්න උච්චාවචනය. | වගාවේ පස් අතර වර්ෂා ජලය රඳවා තබා ගැනීම සඳහා වලවල් කපා පොල් ලෙලි වළලා පසේ තෙතමනය වැඩිකර ගැනීමට කටයුතු කිරීම හා ගිනිසීරියා, පියුරේරියා වැනි ආවරණ බෝග වැවීම.<br><br>පසු කාලීනව වාරි සම්පාදනය සඳහා භාවිතා කිරීමට හා පාංශු තෙතමනය ආරක්ෂා කිරීම තුලින් මුල් මගින් ශාක වලට අවශ්‍ය ජලය සැපයීම සඳහා වර්ෂා ජලය එක් රැස් කර ගැනීමට වැව් වැඩි සංඛ්‍යාවක් පිළිසකර කිරීම.<br><br>පැල හා ශාඛ වල ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා නල මගින් වාරි ක්‍රම ස්ථාපිත කිරිම. |
| නිෂ්පාදනය අඩුවීම | වයස අවුරුදු 50 ට වැඩි මේරූ ගස් ඉහළ ප්‍රතිශතයක් පැවතීම නිසා එම ගස් වියපත්, ඵල නොදරන තත්වයට පත්වීම.<br><br>ඊට අමතරව, අනපේක්ෂිත රෝග හා ස්වාභාවික හේතු ශාක වලට සහ වගාවට බලපෑම. | වයස් ගත ශාක ගහණය වෙනුවට යටි වගා හා නව වගා ඇති කිරීම.<br><br>මයිටා මර්ධනය සඳහා රසායනාගාර 02 ක් පළුගස්වැව වතුයායේ සහ දිවුලපිටිය වතුයායේ ස්ථාපිත කිරීම.<br><br>ඒකාබද්ධ පලිබෝධ කළමනාකරණ උපාය මාර්ග ඇති කිරිම. |
| භාණ්ඩ වෙළඳ චක්‍රය | ආහාර සඳහා ගනු ලබන පොල් හා ආශ්‍රිත නිෂ්පාදන වෙනුවට ආදේශක භාණ්ඩ පැවතීම තුලින් පාරිභෝගික ඉල්ලීම අඩු වීමෙන් මිල පහත වැටීම සහ අස්ථාවර අලෙවිය නිසා විශාල පොල් ගෙඩි ප්‍රමාණයක් වතුයායන් තුල ගොඩ ගැසී තිබීම හා විකල්ප ක්‍රියා මාර්ග නොගත හොත් නරක් වීමට හා විනාශ වීමට ඉඩ තිබීම.<br><br>පාම් තෙල් වැනි තරඟකාරී ආදේශක භාණ්ඩ වල මිල අඩුවීම නිසා වැඩි පාරිභෝගික ආකර්ෂණයකට ලක් වීම තුලින් පොල් මිල හා ඉල්ලුම කෙරෙහි බලපෑම. | පොල් සංවර්ධන අධිකාරියේ වෙන්දේසියට අමතරව එහිදී අලෙවි නොවන පොල් ප්‍රධාන කාර්යාලයේ සෑම සති දෙකකට වරක් පවත්වනු ලබන පොල් පොළේ දී අලෙවි කිරීම.<br><br>අගය එකතු කල නිෂ්පාදන සඳහා යොමු වීම.<br><br>වෙන්දේසියේ දී අලෙවි නොවන පොල් මගින් කොප්පරා නිෂ්පාදනය කර කොටසක් කොප්පරා ලෙස වෙන්දේසියේ දී අලෙවි කිරීම හා ඉතිරිය පලුගස්වැව වතුයායේ ස්ථාපිත කර ඇති තෙල් මෝලේ දී පිරිසිදු පොල්තෙල් නිෂ්පාදනය කිරීම. |
| ණය අවදානම | නීති රෙගුලාසි වලින් බැඳීමට අපොහොසත් වීම මත ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් ගෙවීමට ප්‍රමාද වීමේ ඉඩකඩ තිබීම. | සමීප ගෙවීම් සුපරීක්ෂන ක්‍රමවේද මගින් ගැනුම්කරුවන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම පිළිබඳ සහතික කිරීම.<br><br>ගෙවීම් කල්ගත වී ඇති හෝ ප්‍රතිචාර නොදක්වන ගැනුම්කරුවන්ගෙන් මුදල් පියවා ගැනීම සඳහා නීතිමය මැදිහත් වීම ලබා ගැනීම.<br><br>රජයේ කල්බදු ගෙවීම සුපරික්ෂාකාරීව සොයා බලා ප්‍රමාදයකින් තොරව ගෙවා දැමීම. |

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන් |
|---|---|---|
| සේවක කළමනාකරණය | අඩු ඵලදායීතාවයක් හා නිමැවුමක් ඇති වීමට හේතු වන රැකියාව පිළිබඳ දැනුම හා අභිප්‍රේරණය නොමැතිකම.<br>වැඩි වැටුප් හා ඉහළ තනතුරු අපේක්ෂාවෙන් සේවකයන් වෙනත් ක්ෂේත්‍රයන් හෝ සමාගම් වෙත යාම. | වැඩමුළු හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>මූල්‍ය දිරිදීමනා හා සුභසාධන ක්‍රියාමාර්ග මගින් සේවක ප්‍රතිලාභ වැඩි කිරීම.<br>නිතිපතා සංවාද මගින් සේවක වෘත්තීය සංගම් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.<br>සේවකයින්ට අදාල වන ප්‍රතිලාභ වලට අදාලව පාලන අවශ්‍යතා සියල්ලම ඇති කිරීමට කටයුතු කිරීම.<br>වෘත්තීයමය යෝග්‍යතාවය අනුව ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා හැකි තරම් දුරට අභ්‍යන්තරිකව රැකියා උසස්වීම් ලබා දීමට ක්‍රියාකිරීම. |
| වත්කම් අවදානම | ගිනි, සොරකිය සහ යන්ත්‍රෝපකරණ ක්‍රියා විරහිත වීමේ අවදානම.<br>කෘමීන්, සතුන්ගෙන් වන හානි සහ අකුණුසැර, ගංවතුර වැනි ස්වාභාවික ආපදා. | සියලු ස්පෘශ්‍ය වත්කම් සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීම.<br>එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට වත්කම් රැගෙන යාමේ දී දැඩි පාලන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.<br>ගිනි බාධක ඇති කිරීම මගින් පිටත සිට ආයතනයේ වතු වලට ගින්න පැතිරීම වලක්වා ගැනීම හා අනෙකුත් පූර්ව ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීම.<br>හානි වළක්වා ගැනීමේ නඩත්තු වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාවට නැංවීම.<br>යහපත් කෘෂිකාර්මික ක්‍රමවේද අනුගමනය කිරීම. |
| ප්‍රාග්ධන ආයෝජන අවදානම | අපේක්ෂිත ලාභ නොලැබීමේ අවදානම සහ ආයෝජන වලින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම. | ආයෝජන මට්ටම් අනුව හා අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීම් කාලය පදනම් කර ගනිමින් ප්‍රාග්ධන වියදම් අනුමත කිරීම සඳහා දැඩි පාලන ක්‍රමවේද අනුගමනය කිරීම. |
| කීර්තිනාම අවදානම | ආයතනයක පළිබඳව හා වෙළඳාම, සේවා නියුක්තිය, කාර්ය පටිපාටියට අදාල මූලධර්ම, ක්‍රියාපටිපාටින්, ප්‍රමිතීන්, නීති හා රෙගුලාසි පිළිබඳ ප්‍රමානවත් අවබෝධයක් නොමැති වීම.<br>පාරිභෝගික හෝ වෙළඳපොල අවශ්‍යතා හා ප්‍රමිති වලට නොගැලපෙන නිෂ්පාදන.<br>කාර්ය සාධනය, ඉලක්ක හා ප්‍රමිති පිළිබඳ දැනුම නොමැතිකම. | කාර්ය මණ්ඩලය, බැංකුකරුවන්, පාරිභෝගිකයන් වැනි විවිධ උනන්දුවක් දක්වන පාර්ශව සමඟ ඵලදායී සන්නිවේදනයක් ඇති කිරීම.<br>නිෂ්පාදන ප්‍රමිතිය, නිෂ්පාදන ක්‍රමවේදය ප්‍රමිතිගත මට්ටමින් පවත්වාගෙන යාම.<br>අයවැය ක්‍රියාවලියේ හා අයවැය පාලන ක්‍රමවේදයක් මාසිකව අනුගමනය කිරීම මගින් සමාගමේ කාර්යසාධනය එහි ඉලක්ක සමඟ අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කිරීම.<br>භාණ්ඩ හා සේවා වල ගුණාත්මක භාවය පිළිබඳ පාරිභෝගික ප්‍රතිචාර ලබා ගැනීම. |

# විගණන කමිටු වාර්තාව

සෑම රාජ්‍ය ආයතනයක් සඳහාම විගණන කමිටු ස්ථාපිත කිරීම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයකි. අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් මෙම කමිටුව සමන් විය යුතු අතර මහා භාණ්ඩාගාර නියෝජිත හෝ මූල්‍ය කළමණාකරන හැකියාවන් ඇති අධ්‍යක්ෂකවරයෙකු මෙහි මුලසුන හෙබවිය යුතුය. මෙම කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් පහසුකම් සපයන්නා ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහභාගීත්වයෙන් රැස්විය යුතු අතර කමිටු නිරීක්ෂණයන් සුදුසු නිර්දේශයද සමඟ අවශ්‍ය තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

## භාවිත යෙදුම්

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 55 නියමයන්ට අනුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සකසා නිර්දේශිත භාවිත යෙදුම් අනුව විගණන කමිටුව ක්‍රියාත්මක වෙයි. අභ්‍යන්තර විගණන අංශයේ වගකීම් තීරණය කිරීම, වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කිරීම, අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීම, අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන වාර්තා හා කළමණාකරන ලිපි සමාලෝචනය වැනි කරුණු කෙරෙහි කමිටුවේ අවධානය යොමු කරයි.

## සංයුතිය

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 55ට අනුව හලාවත වැවිලි සමාගමෙහි විගණන කමිටුව මහා භාණ්ඩාගාර නියෝජිතද ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා මෙම කමිටුවේ මූලාසනය හොබවයි.

වර්තමාන විගණන කමිටු සාමාජිකයින් පහත පරිදි වේ.

- පි.බි.එස්.සි. නෝනිස් මහතා
  - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික හා විගණන කමිටු සභාපති
- ඒ. ලක්කදාස් මහතා
  - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
- ආනන්ද පුෂ්පකුමාර මහතා
  - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික

සමාගමෙහි ලේකම්වරුන් වන කෝපරේට් ඇඩ්වයිසරි සර්විස් විගණන කමිටුවේද ලේකම්වරු ලෙස කටයුතු කරයි. ප්‍රධාන අභ්‍යන්තර විගණක විගණන විමල් හේමචන්ද්‍ර මහතා විගණන කමිටුව රැස්කරන්නා ලෙස කටයුතු කරයි.

**රැස්වීම් පැවැත්වූ දිනයන් හා සහභාගීත්වය,**

| විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්ගේ නම | 2017 මාර්තු මස 10 | 2017 ජුනි මස 28 | 2017 අගොස්තු මස 14 | 2017 නොවැම්බර් මස 01 | 2017 දෙසැම්බර් මස 14 |
|---|---|---|---|---|---|
| පි.බි.එස්.සි. නෝනිස් මහතා | √ | √ | √ | √ | √ |
| ඒ. ලක්කදාස් මහතා | √ | √ | √ | √ | √ |
| ආනන්ද පුෂ්පකුමාර මහතා | √ | √ | - | - | - |

(ආනන්ද පුෂ්පකුමාර මහතා 2017 ජුනි මස 28 වන තෙක් විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය)

අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් මෙන්ම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ද ආරාධනයට අනුව කමිටුවට සහභාගි වේ. 2017 වර්ෂය තුලදී සමාගමේ වතුවල නිත්‍ය විගණන වාර්තා, විශේෂ විමර්ශන වාර්තා සහ ව්‍යාපෘති වල ප්‍රගතිය මෙන්ම විගණකාධිපති විසින් යොමු කර ඇති අනුකූලතාවය විගණන විමසුම් හා ඊට අදාල කළමණාකරනයේ පිළිතුරුද සාකච්ඡාවට භාජනය කර ඇත.

## අනුකූලතාවය

ආයතනය පවත්නා ව්‍යවස්ථාපිත නීතීන් හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක වන බව හා මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවට විගණන කමිටුව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත සහතික වේ. කමිටුව පවත්නා පාලන ක්‍රමවල ප්‍රමාණාත්මක භාවය සහ අවධානම් කළමණාකරන ක්‍රමවේදය තක්සේරු කරන අතර පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය අමතර පාලන ක්‍රමයන් හා අවදානම් අවම කිරීමේ උපාය මාර්ග සකසා අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කරනු ලබයි.

කමිටුව විසින් සමාගමේ දෛනික ව්‍යාපාර කටයුතු විශ්ලේෂණය කරනු ලබන අතර අනාගත අපේක්ෂිත ව්‍යාපාරික ක්‍රියාකාරීත්වය පිළිබඳ තක්සේරු කිරීම හා ඒ අනුව මූල්‍ය වාර්තා වලට අනුව අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම කරනු ලැබේ.

## බාහිර විගණනය

හලාවත වැවිලි සමාගමේ බාහිර විගණකයින් ලෙස විගණකාධිපති කටයුතු කරනු ලබයි.

**පී.බී.එස්.සී. නෝනිස්**
**සභාපති/විගණන හා කළමනාකරණ කමිටුව**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා විගණකාධිපති වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

## නෛතික තත්වය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදි) සහ 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්ථනය කිරීමේ පනත අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ වගකීමෙන් සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර කොළඹ කාර්යාලය කොළඹ 07, ධර්මපාල මාවත, අංක 191, ජේ ආර් ජයවර්ධන මධ්‍යස්ථානය යන ලිපිනයෙහි පිහිටා ඇත. වතු යායන් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.

පහත සඳහන් ආකාරයට වතු කලාප 06 ක් යටතේ පාලනය කෙරේ.

පලුගස්වැව වත්ත  
බිංගිරිය වතු කලාපය  
හලාවත වතු කලාපය  
දිවුලපිටිය වතු කලාපය  
මාදම්පේ වතු කලාපය  
තම්බපන්නි වතු කලාපය

## ප්‍රධාන ක්‍රියාකාරකම්

ප්‍රධාන වැවිලි භෝගය ලෙස පොල් සහ වෙනත් කෘෂි භෝග වගා කිරීම, නිෂ්පාදනය, පශු සම්පත් හා අනෙකුත් නිෂ්පාදන අලෙවි කිරීම.

## මූල්‍ය වාර්තා

2018 අගෝස්තු මස 10 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි අනුමත කරන ලද මූල්‍ය වාර්ථා පිටු අංක 40 සිට 72 දක්වා සඳහන්ව ඇත.

## විගණන වාර්තා

සමාගමේ මූල්‍ය වාර්තා මත විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව පිටු අංක 37 සහ 39 හි සඳහන්ව ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි යොදා ගත් ගිණුම්කරන ප්‍රතිපත්ති පිටු අංක 44 සිට 55 දක්වා සඳහන්ව ඇති අතර, පසුගිය වසර හා සංසන්දනය කිරීමේදි ගිණුම් කරන ප්‍රතිපත්ති වල වෙනසක් සිදු කර නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

සමාගමේ කටයුතු පුරෝකථනය කල හැකි අනාගතයක් දක්වා ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහිමකට පත්ව ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ බව'' යන සංකල්පය මත සකසා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

2017 වර්ෂයේ සමාගමේහි අධ්‍යක්ෂ මණ්ඩලය සංක්ෂිප්තව පහත පරිදි වේ.

### 2017 අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| වී.කේ.සී. හේරත් මහතා (2016/07/14 සිට) | සභාපති |
| එම්.කේ.බී. සෙනවිරත්න මහතා (2015/05/08 සිට) | විධායක අධ්‍යක්ෂ |
| පී.සී. විජේවර්ධන මහතා (2017/02/24 සිට) | ක්‍රියාකාරි අධ්‍යක්ෂ |
| පී.බී.එස්.සී. නොනිස් මහතා (2016/09/05 සිට) | අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත |
| ඒ. ලක්කතාස් මහතා (2016/05/19 සිට) | අධ්‍යක්ෂ |
| කෙ.ජී.ඒ. පුෂ්පකුමාර මහතා (2016/07/14 සිට) | අධ්‍යක්ෂ 2017/02/24 වන දින දක්වා තනතුරේ රාජකාරි කරන ලදි. |
| එච්.එම්.එන්.සී. හේරත් මහතා (2015/03/20 සිට) | අධ්‍යක්ෂ |

## විගණන කමිටුව

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුව නියෝජනය කළ අතර වසර තුළ ඇගයීම් 5 ක් සිදු කර ඇත.

### විගණන කමිටුව -2017

| | |
|---|---|
| පී.බී.එස්.සී. නොනිස් මහතා | සභාපති |
| ඒ. ලක්කතාස් මහතා | සමාජික |
| කෙ.ජී.ඒ. පුෂ්පකුමාර මහතා (2017/02/24 දින දක්වා) | සමාජික |
| රජයේ විගණකාධිපති දෙපාර්ථමේන්තුව | නිරික්ෂක |

## කාර්යය සාධනය

වර්ෂය තුල සමාගමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා සහ වැදගත් කළමනාකරණ සහ සංවර්ධන වැඩසටහන් පිළිබද සභාපතිතුමාගේ සමාලෝචනය හා කළමනාකරණ හා මූල්‍ය සමාලෝචනය යටතේ දක්වා ඇත.

## අයභාරය

2017 වසර තුල සමාගමේ අයභාරය රුපියල් මිලියන 516 ක් වන අතර (2016 රු. මිලියන 383) වර්ෂය තුල වෙනත් මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 59 ක් විය. (2016 - රු.මි.66)

වර්ෂය තුලදී මූල්‍ය ආදායම රු.මිලියන 18 ක් වූ අතර විගණනය කරන ලද මූල්‍ය වර්ථා වල එය දක්වා ඇත.

## මූල්‍ය ප්‍රතිඵල

සමාගම 2017 වර්ෂය තුල රු. මි. 126.4 ක බදු පෙර ලාභයක් ලබාගෙන ඇත. (2016 - රු. මි. 84.8)

බදු වශයෙන් රු.මි. 44.9 ක් වෙන් කිරිමේන් පසු සමාගම සමාලේචිත වර්ෂය තුල රුපියල් මිලියන 81.4ක ලාභයක් 2017 වර්ෂය තුල වාර්තාකර ඇත (2016 - රුපියල් මිලියන 69.6). විස්තරාත්මක මූල්‍ය ප්‍රතිඵල විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශනය තුල ඇතුලත් වේ.

## ස්ථාවර වත්කම්

2017 වර්ෂය තුලදී සමාගම රු. මිලියන 84 ක් (2016 වර්ෂයේදී රු. මිලියන 86) නව වගාවන් යටි වගාවන් හා නොමේරු වගාවන් නඩත්තුව වෙනුවෙන්ද රු. මිලියන 30 ක් ද දේපල පිරියත උපකරන වෙනුවෙන්ද ආයෝජනය කරන ලදි. (2016 රු. මිලියන 16)

2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයට අනුව ජංගම නොවන වත්කම් (දේපල, පිරියත, උපකරන, ජෛව වත්කම්, කල්බදු වත්කම්) වල ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 1062 කි. (2016 රු. මිලි. 978) විස්තර විගණන මූල්‍ය වාර්තාවේ 04 සිට 08 සහ 11යන සටහන් තුල දක්වා ඇත.

## කෙටි කාලීන ආයෝජන

2016 වර්ෂයේ රු. මිලියන 140.8 ට සාපේක්ෂව 2017 වර්ෂයේදී සමාගමේ කෙටි කාලීන අයෝජන රු. මිලියන 190.3 ක් විය. මෙම ආයෝජන රු. මිලියන 102.3 ක් ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු වලද මිලියන 88 ක් භාණ්ඩාගාර බිල් පත් වලද ආයෝජනය කර ඇත.

## සංචිත

2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ ඇති සම්පූර්ණ සංචිත රු. මිලියන 665.5 ක් වූ සමුච්චිත ලාභයෙන් හා රු. මිලියන 82.3 ක් වූ දැව සංචිතයෙන් සමන්විත වේ.

සංචිත වල වෙනස් වීම සහ සංයුතිය විගණනය කරන ලද මූල්‍ය වාර්තා වල ස්කන්ධය වෙනස් විමේ ප්‍රකාශයෙන් දැක්වේ.

## බදුකරණය

සමාගම කෘෂිකාර්මික ලාභය මත 10% ක බදු අනුපාතයකට හා අනෙකුත් ආදායම් ප්‍රභවයන්ගේ ආදායම් මත 28% බදු අනුපාතයකටද යටත් වේ. බදු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 23 තුල දක්වා ඇත.

## කොටස් ප්‍රාග්ධනය

2017 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ සමස්ත කොටස් ප්‍රාග්ධනය රු. 200,000,010 ක් විය. ස්වර්ණමය කොටස් ඇතුලුව 20,000,001 කින් සමන්විත වේ. කිසිදු ආකාරයක කොටස් නිකුත් කිරිමක් 2017 වසර තුල සිදු කර නොමැත.

## ප්‍රාග්ධන බැදීම් සහ අසම්භාව්‍ය වගකීම්

අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳිම් විගණන වාර්තාවේ සටහන් අංක 27 හි අන්තර්ගත කර ඇත.

## මූල්‍ය වාර්තාව ඉදිරිපත් කරන දිනට පසු සිදුවිම

මූල්‍ය වාර්තාවල සටහන් අංක 25 තුල හෙළිදරව් කර ඇති කරුණු හැර සමාගම කෙරෙහි ප්‍රමානාත්මක බලපෑමක් සිදු කල හැකි ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් කිසිවක් නොමැත.

## අධ්‍යක්ෂකවරුන්ගේ බැදීම්

සමාගමේ ගිණුම් වාර්තා වල සටහන් අංක 26 හි ප්‍රකාශ කර ඇති කරුණු හැර අධ්‍යක්ෂ වරුන්ගේ සෘජු හෝ වක්‍ර වෙනත් බැදීම් නොමැත.

## අධ්‍යක්ෂකවරුන්ගේ කොටස් හිමිකම

සමාගමේ කිසිම අධ්‍යක්ෂ වරයෙක් හෝ ඔහුගේ / ඇයගේ කාලත්‍රයෙකු සමාගමේ කොටස් හිමිකම් දරන්නේ නැත.

## සේවා නියුක්තිය

සමාගමේ තිරසාර උන්නතිය සදහා රජයේ නීති වලට අනුකූලව කටයුතු කරන අතර සේවකයින් සම්බන්ධයෙන් පුහුණුව, උසස්වීම්, විනයානුකුල තීරණ ආදි කරුණු සම්බන්ධව සියලුම සේවකයින්ට කුසලතාව පදනම්ව එක හා සමාන අවස්ථාවන් සලසනු ලබයි. එසේම සමාගම සේවනයන්ට සම තැන පදනම මූලික කර ගනිමින් සෑම සේවා නියුක්තිකයෙකු හටම ලිංග බේදය, ජාති බේදය, ආගම, විවාහක තත්වය, දේශපාලන පසු බිම හෝ කායික දුබලතාවයන් නොසලකා සම අවස්තාවන් ලබා දිමට කටයුතු කරනු ලබයි.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු සහ සමාගමේ සේවා නියුක්තියන් සඳහා ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට හෝ අධ්‍යක්ෂක වරුන් සහතික වේ.

## විගණකවරු

2017 වසරට අදාල ගිණුම් වාර්තා විගණකාධිපති දෙපාර්ථමේන්තුව විසින් විගණනය කරන ලදී.

මූල්‍ය වාර්තා සඳහා විගණන මතය පිටු අංක 37-39 තුල අන්තර්ගතව පවතී.

විගණකයින් විසින් තත්වාගණනය කල මතයක් ඉදිරිපත් කර ඇති අතර, තත්වාගණනය කල විගණන මතයට පදනම් වු කරුණු අංක ඒ, බී, සී, ලෙස විගණන වර්තාව තුල අන්තර්ගත වේ.

තත්වාගණනය කල මතයට පදනම් වු ඉහත සඳහන් කරුණු සම්බනධයෙන් කළමනාකරණය මේ වන විට පහත පියවර ගෙන ඇත.

ඒ). මිනින්දෝරු දෙපාර්ථමේන්තුව විසින් ඉඩම් සිතියම් ගත කිරීම මේ වන විටත් සිදු කරමින් පවතින අතර, කොටසක වැඩ අවසන් කර ඇත.

බී). රාජ්‍ය ආයතන වෙත ලබා දී ඇති ණය මුදල් ආපසු නොලැබීම මත හානි කරන අලාභ වෙන කිරීම් 2014 ගිණුම් වාර්තා තුල ගිණුම්කරන ප්‍රමිත LKAS 39 ට අනුව සිදුකර ඇත.

## වාර්ෂික මහා සභා රැස්වීම

හලාවත වැවිලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2019 ජුනි 07 වන දින පස්වරු 2.00 ට කොළඹ 07, ධර්මපාල මාවත, නො. 191, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයේ පිහිටි හලාවත වැවිලි සමාගමේ කොළඹ කාර්යාලයේදී පැවැත්වීමට නියමිතය,

මහා සභා රැස්වීමේ නිවේදනය සහ පෙරකලාසි පෝරමය මේ සමග අමුණා ඇත.

මෙම වාර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

වෙනුවෙන් අත්සන් කරන ලදී.

වි.කේ.සි. හේරත් මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි

එම්.කේ.බී. සෙනවිරත්න මහතා
විධායක අධ්‍යක්ෂ

කෝපරේට් අඩ්වයිසරි සර්විස් (පුද්) සමාගම
ලේකම්වරු, හලාවත වැවිලි සමාගම
කොළඹ.

# අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් පිළිබඳ ප්‍රකාශය

2017 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමේ මූල්‍ය වාර්තාකරනය පිළිබඳව වගකීම හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි. සමාගමේ විගණක වන විගණකාධිපතිතුමාගේ වගකීම පිළිබඳ සිය වාර්තාවෙන් සංක්ෂිප්තව දක්වා ඇත.

මෙම වාර්තාවේ ඇතුලත් කර ඇති 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර තොරතුරු එමගින් දක්වා ඇත.

සමාගම සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇති බවටත් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල සියලු ගිණුම්කරන ප්‍රමිතීන් භාවිතා කල බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතිකවේ. මෙම ප්‍රමිතීන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් වන අවස්ථා ඇතොත්, ඒවා නිසිආකාරයෙන් අනාවරණය කර ඇති අතර ඊට හේතු පැහැදිලි කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා භාවිතා කරන ලද විනිශ්චයන් සහ ඇස්තමේන්තු සාධාරණ හා විචක්ෂණශීලි වෙයි. සමාගම තම මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවයන් හා සාධාරණ ලෙස නිර්වචනය කිරීම සඳහා නිසි ලෙස මූල්‍ය වාර්තා පවත්වාගෙන යාමේ වගකීම පිළිබඳ අධ්‍යක්ෂවරු සහතික වේ. වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ කාර්යයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් අන්තර්ගත වන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කර සිටීයි.

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළබඳව සමස්ථ වගකීම අධ්‍යක්ෂවරු වෙත පැවරේ. ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වාලන අභ්‍යන්තර පාලන ක්‍රමවේද පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරමින් ඔවුන් විසින් ස්ථාපිත කරන ලද අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ගෙන් සමන්විත අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන, මූල්‍ය හා වෙනත් පාලන ක්‍රමවේදයන් මගින් ගණුදෙනු නිසි අධිකාරියට අනුව සිදු වන බවට හා නිසි පරිදි වාර්තා වන බවටත් සියලු වත්කම් ආරක්ෂා විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වා හෝ සධාරණ කාලයක් තුල දැන ගැනීමට හැකි වන පරිදි සකසා ඇති බව සනාථ කරයි.

ඉදිරි වසර ගණනාවක් පුරා අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණාත්මකව ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අඛණ්ඩ පැවැත්ම නොවෙනස්ව අනුගමනය කරනු ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරික්ෂණයන් හා සමාලෝචනයන් කිරීමට සියලුම තොරතුරු සහ සහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලුම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තා, අදාල දත්ත සමග පරික්ෂා කර ඔවුන් ගේ නිදහස් අදහස් පළ කර ඇති අතර, එම වාර්තාද වාර්ෂික වාර්තාව තුල ඇතුලත් කර ඇත.

සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු හා සමාගමේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,



සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විස් (පුද්) සමාගම

ලේකම්වරු, හලාවත වැවිලි සමාගම

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. PLA/A/CPL/01/17/ 01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 11th September 2018

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ කොටස් හිමියන් වෙත.

**සීමාසහිත හලාවත වැවිලි සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------

(අ) සමාගම සතු කල්බදු වටිනාකම රු.142,502,287 ක් වූ හෙක්ටයාර් 5,733 ක ඉඩම් වලට අදාල පිඹුරුපත් සමාගම සතුව නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් අයවිය යුතු වටිනාකම පිළිවෙලින් රු.47,627,397 ක් හා 23,610,959 ක සඳහන් වුවද, අදාල ආයතන විසින් 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල ශේෂ සනාථන ලිපි අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.63,672,397 ක් හා 31,610,959 ක් විය.

(ඇ) සමාගම විසින් සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව හා රාජ්‍ය සම්පත් හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයට 2010 වර්ෂයේදී ලබාදුන් කෙටිකාලීන ණය මුදල් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු පිළිවෙලින් රු.10,000,000 ක හා රු.15,000,000 ක ශේෂ තහවුරු කරගැනීමට අදාල ශේෂ සනාතන ලිපි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත හලාවත වැවිලි සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

-------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) * විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ඇති බවත්,

* සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**වාර්ෂික වාර්තා සභාගත කිරීම**

------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

# හලාවත වැවිලි සමාගම

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| අයභාරය | 19 | 516,178,934 | 383,089,914 |
| විකුණුම් පිරිවැය | | (310,604,719) | (234,382,941) |
| **දළ ලාභය** | | **205,574,215** | **148,706,973** |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ප්‍රතිලාභ | 20 | 59,159,259 | 65,941,736 |
| පරිපාලන වියදම් | | (110,679,954) | (102,545,104) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (12,352,180) | (8,692,761) |
| **මෙහෙයුම් තුළින් ජනනය වූ ලාභය** | | **141,701,341** | **103,410,843** |
| ශුද්ධ මූල්‍ය ලාභය | 21 | (15,286,608) | (18,594,220) |
| බදු පෙර ලාභය | 22 | **126,414,733** | **84,816,623** |
| බදු වියදම් (වෙන්කිරීම්) | 23 | (44,968,495) | (15,144,615) |
| **වර්ෂය සඳහා ලාභය** | | **81,446,237** | **69,672,008** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභය/අලාභය | | 702,850.00 | 1,091,543 |
| **වර්ෂයට මුළු විස්තීර්ණ ආදායම් බදු පසු** | | **82,149,087** | **70,763,551** |
| කොටසක ඉපැයුම | 24 | **4.07** | **3.48** |

වරහන් තුළ ඇත්තේ අඩුකිරීම්ය.

පිටු අංක 44 සිට 72 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

හලාවත,
2018, අගෝස්තු මස 10 වන දින.

## හලාවත වැවිලි සමාගම

### මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ජනවසම වතුවල හිස් ඉඩම්වල කල්බදු හිමිකම් | 04 | 73,799,983 | 76,488,705 |
| ජනවසම කල්බදු දේපල පිරියත හා උපකරණ හිමිකම් (භාවිතයට ගැනීමට අයිතියක් ඇති ඉඩම් කල්බදු ජෛව හිමිකම් හැර) | 05 | 960,504 | 1,434,812 |
| ජනවසම වතුයායන්වල ජෛව වත්කම් වල කල්බදු හිමිකම | 06 | 24,044,542 | 26,893,743 |
| කල්බදු දේපල සංවර්ධනය | 7.1 | 778,042,874 | 701,639,467 |
| ජෛව වත්කම් පශු සම්පත් | 7.2 | 16,096,612 | 25,237,670 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් | 7.3 | 54,522,442 | 42,245,501 |
| සින්නක්කර දේපල පිරියත හා උපකරණ හිමිකම් | 08 | 106,238,263 | 96,643,719 |
| වෙනත් මූල්‍ය වත්කම් | 11.1 | 8,384,410 | 7,598,658 |
| | | 1,062,089,630 | 978,182,276 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 09 | 58,753,590 | 100,758,752 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 10 | 34,686,633 | 48,435,673 |
| රාජ්‍ය ව්‍යවසායන්වලට සපයන ලද මූල්‍ය පහසුකම් | 11 | | |
| වෙනත් මූල්‍ය වත්කම් | 11.1 | 3,735,301 | 3,413,278 |
| වෙනත් ජංගම වත්කම් | | 1,726,563 | 1,929,727 |
| කෙටි කාලීන ආයෝජන | 12 | 190,312,500 | 140,868,261 |
| මුදල් හා බැංකු ශේෂයන් | | 4,465,074 | 5,087,898 |
| | | 293,679,661 | 300,493,589 |
| **මුළු වත්කම්** | | **1,355,769,291** | **1,278,675,864** |
| | | | |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| කොටස් ප්‍රාග්ධනය | 13 | 200,000,010 | 200,000,010 |
| රඳවා ගත් ඉපැයීම් | | 665,548,027 | 633,885,863 |
| දැව සංචිත | | 82,327,840 | 61,840,917 |
| **මුළු ස්කන්ධය** | | 947,875,877 | 895,726,790 |
| **ජංගම නොවන වගකීම් සහ විලම්භිත ආදායම්** | | | |
| විලම්භිත බදු බැරකම | 14 | 101,325,132 | 61,850,251 |
| විලම්භිත ආදායම් - ප්‍රදාන හා ආධාර | 15 | 6,395,901 | 6,791,464 |
| විශ්‍රාමික ප්‍රතිලාභ පාරිතෝෂිත බැඳීම් | 16 | 74,382,849 | 72,493,267 |
| කල්බදු ගිවිසුම් යටතේ ඇති බැඳියාවන් -ජනවසම | 17 | 105,004,349 | 107,223,139 |
| | | 287,108,231 | 248,358,121 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීමට ඇති දෑ | 18 | 121,213,233 | 135,832,364 |
| ආදායම් බදු බැරකම් | | (2,646,841) | (3,374,863) |
| කල්බදු ගිවිසුම් යටතේ ඇති බැඳියාවන් - ජනවසම | 17 | 2,218,790 | 2,133,452 |
| | | 120,785,182 | 134,590,953 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **1,355,769,291** | **1,278,675,864** |

වරහන් තුළ ඇත්තේ අඩුකිරීමය

පිටු අංක 44 සිට 72 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**සනාථ කිරීම.**

2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශය පිළියෙල කර ඇති බව සහතික කරමි.

**ආර්. එම්. ආර්. බී. රත්නායක**
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී

මෙම මූල්‍ය වාර්තා සැකසීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරනු ලැබේ.

**වී.කේ.සී. හේරත්**
සභාපති

**එම්.කේ.බී. සෙනවිරත්න**
විධායක අධ්‍යක්ෂ

**හලාවත,**
**2018, අගෝස්තු මස 10 වන දින.**

**ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය**
2016 දෙසැම්බර් 31 දිනට

| විස්තරය | කොටස් ප්‍රාග්ධනය<br>රු. | දැව සංචිත<br>රු. | සමුච්චිත ලාභය<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | 200,000,010 | 56,686,452 | 598,276,777 | 854,963,239 |
| වර්ෂයේ ලාභය | | | 69,672,008 | 69,672,008 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | | 1,091,543 | 1,091,543 |
| දැව සංචිතයට මාරු කිරීම | - | 5,154,465 | (5,154,465) | |
| **මුළු විස්තීර්ණ ආදායම්** | | 5,154,465 | 65,609,086 | 70,763,551 |
| 2015 සඳහා ලාභාංශ | | | (30,000,000) | (30,000,000) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **61,840,917** | **633,885,863** | **895,726,790** |
| වර්ෂයේ ලාභය | - | | 81,446,237 | 81,446,237 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | 702,850 | 702,850 |
| දැව සංචිතයට මාරු කිරීම | | 20,486,923 | (20,486,923) | |
| **මුළු විස්තීර්ණ ආදායම්** | 200,000,010 | 82,327,840 | 695,548,027 | 977,875,877 |
| 2016 සඳහා ලාභාංශ | | | (30,000,000) | (30,000,000) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **82,327,840** | **665,548,027** | **947,875,877** |

වරහන් තුළ ඇත්තේ අඩුකිරීම්ය

පිටු අංක 44 සිට 72 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**හලාවත,**
**2018, අගෝස්තු මස 10 වන දින.**

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ / (යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| බදු පෙර ලාභය | 126,414,733 | 84,816,623 |
| **ගැලපීම්** | | |
| - ක්ෂයවීම් /ක්‍රමක්ෂයවීම් | 34,566,375 | 39,174,417 |
| - සේවක ලාභ කොටස් සඳහා වෙන් කිරීම | 11,192,570 | 7,828,181 |
| - ප්‍රදාන සඳහා වූ ක්‍රමක්ෂයවීම් | (395,563) | (398,962) |
| - රාජ්‍ය කල්බදු සඳහා මූල්‍ය ගාස්තු | 33,697,488 | 32,115,849 |
| - බොල් ණය ප්‍රතිපාදන | - | (421,258) |
| - මූල්‍ය ආදායම් | (18,410,880) | (14,193,632) |
| - නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය හා වෙන්කිරීම් | 13,790,597 | 12,983,458 |
| - දේපල, පිරියත, හා උපකරණ අපහරණය කිරීමෙන් ලත් ලාභය | - | 30,187 |
| - පාරිභෝජ්‍ය ජෛව වත්කම් ලාභ/අලාභ | (20,486,923) | (5,154,465) |
| - පොල් ගස් අලෙවි කිරීමෙන් ලද ලාභය | (16,884,139) | (17,356,052) |
| | **163,484,259** | **139,424,346** |
| **වෙනස්වීම්** | | |
| - තොගවල වැඩිවීම/ (අඩුවීම) | 42,005,162 | (57,386,187) |
| - කිරි පශු සම්පත් | 9,141,058 | (11,490,500) |
| - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 18,769,672 | (9,994,653) |
| - වෙනත් ජංගම වත්කම් | 203,164 | 2,523,515 |
| - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 1,252,958 | 51,991,929 |
| | **234,856,272** | **115,068,450** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| - නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම් | (11,198,165) | (7,232,768) |
| - සේවක ලාභ කොටස් සදහා ගෙවීම් | (7,817,498) | (8,868,397) |
| - මූල්‍ය වියදම් ගෙවීම් | (59,112,074) | (32,115,849) |
| - මූල්‍ය ආදායම් ලැබීම් | 20,207,990 | 12,670,316 |
| - ආදායම් බදු ගෙවීම් | (4,765,592) | (3,569,391) |
| - දැවමය ගස් විකිණීමෙන් ලද මුදල් | 8,231,482 | 24,542 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **180,402,415** | **75,976,903** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| - දේපල, පිරියත හා උපකරණ එකතු කිරීමෙන් | (30,597,470) | (16,344,955) |
| - ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | (84,058,761) | (86,367,236) |
| - පොල් ගස් විකිණීමෙන් ලද මුදල් | 16,966,774 | 17,465,910 |
| - සේවක ණය ප්‍රදානය | (5,520,550) | (6,528,200) |
| - සේවක ණය අයකර ගැනීම | 3,762,458 | 3,772,691 |
| - කෙටිකාලීන ආයෝජන | (37,312,500) | 8,430,257 |
| - දේපල පිරියත හා උපකරණ අලෙවියෙන් ලැබීම් | | (30,187) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **(136,760,048)** | **(79,601,720)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| - ලාභාංශ ගෙවීම් | (30,000,000) | |
| - රාජ්‍ය කල්බදු සඳහා ප්‍රාග්ධන පියවීම් | (2,133,452) | (2,051,396) |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (32,133,452) | (2,051,396) |
| මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | 11,508,915 | (5,676,213) |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම (සටහන අ) | 80,956,159 | 86,632,372 |
| වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම (සටහන ආ) | **92,465,074** | **80,956,159** |
| **සටහන (අ)** | | |
| මුදල් හා මුදල්වලට සමාන දෑ වසර ආරම්භයේ | | |
| කෙටි කාලීන ආයෝජන | 75,868,261 | 79,215,885 |
| මුදල් හා බැංකු ශේෂයන් | 5,087,898 | 7,416,487 |
| | **80,956,159** | **86,632,372** |
| **සටහන (ආ)** | | |
| මුදල් හා මුදල්වලට සමාන දෑ වසර අවසානයේ | | |
| කෙටි කාලීන ආයෝජන | 88,000,000 | 75,868,261 |
| මුදල් හා බැංකු ශේෂයන් | 4,465,074 | 5,087,898 |
| | **92,465,074** | **80,956,159** |

වරහන් තුළ ඇත්තේ අඩුකිරීමය.

පිටු අංක 44 සිට 72 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

හලාවත,
2018, අගෝස්තු මස 10 වන දින.

# හලාවත වැවිලි සමාගම

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන්**
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට

## 1 සංස්ථාපිත තොරතුරු

### 1.1 වාර්තාකරණ ස්ථිතිය

#### 1.1.1 පිහිටුවීම සහ නෛතික ආකෘතිය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදී) සහ 1987 අංක 23 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධි විධානයන්ට අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ වගකීමෙන් සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර කොළඹ කාර්යාලය කොළඹ 07, ධර්මපාල මාවත, අංක 191, ජේ ආර් ජයවර්ධන මධ්‍යස්ථානය යන ලිපිනයෙහි පිහිටා ඇත. වතු යායවල් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්කවල පිහිටා ඇත.

#### 1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

පොල් වගා කිරීම, කොප්පරා නිෂ්පාදනය හා අමු පොල් හා කොප්පරා අලෙවිය වසර තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

#### 1.1.3 පරිපාලකය සහ අවසන් පරිපාලකය

සමාගමේ පරිපාලකය වනුයේ ශ්‍රී ලංකා රජයයි.

### 1.2 නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

2018 අගෝස්තු මස 10 වන දින දරන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අනුව 2017 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදී.

## 2 සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ 1995 අංක 15 දරන පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (CASL) විසින් නිකුත් කරන ලද ණප්‍රමිත (SLFRS/LKAS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව සකසා ඇත.

### 2.2 ඇගයීම් පදනම

මූල්‍ය ප්‍රකාශනවල අංක 04, 05 සහ 06 දරන සටහන්වල විස්තර කර ඇති පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් එනම්, කල්බදු ගිවිසුම් යටතේ ඇති JEDB වතු හැරුණු කොට ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. සුදුසු පරිදි විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල විස්තර කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශනවල ඇති උද්ධමනීය සාධක සඳහා ගැලපීමක් සිදු කර නැත.

### 2.3 භාවිතා කරන සහ ඉදිරිපත් කරන මුදල් ඒකකය

සමාගමේ භාවිතා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් මගින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට දක්වා ඇත.

### 2.4 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලවන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අදාළ කර ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් යනාදියට බලපාන ඇස්තමේන්තු විනිශ්චය සහ උපකල්පිතයන් තීරණය කිරීමට කළමනාකරණයට සිදු වේ. විනිශ්චයන් හා ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ වාතාවරණ යටතේ සාධාරණ වන බවට විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළු ඓතිහාසික අත්දැකීම් හා අනෙක් සාධක මත පදනම්වය. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන පවත්නා පදනම මත සමාලෝචනය කර ඇත. ඇස්තමේන්තු සංශෝධනය එම කාලපරිච්ඡේදයට හා  අනාගත කාල වකවානුවට බලපාන්නේ නම් එම කාලපරිච්ඡේදය තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනය ද සිදු කරනු ලැබේ.

## 2.5 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමාගමේ හැකියාව සමාගමේ කළමනාකාරීත්වය විසින් ඇගයීමට ලක් කර ඇති අතර නුදුරු අනාගත කාලයක් දක්වා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගමට තිබෙන බවට සෑහීමකට පත්විය. තව ද ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව කර ගෙන යාමේ සමාගමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු තරමේ සැකයක් ඇති කළ හැකි කිසියම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරීත්වයට වාර්තා වී නොමැත. අඛණ්ඩ බව පිළිබඳ සංකල්පය පදනම්ව මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව සකස් කරනු ලැබේ.

## 2.6 සංසන්දනාත්මක තොරතුරු

ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වා ගෙන යන අතර ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට ගැලපෙන පරිදි අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර ඇත.

## 2.7 වාර්තාකරණ දිනයෙන් පසු හටගත් සිද්ධීන්

වාර්තාකරණ දිනයෙන් පසු හටගත් සියලුම ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම හෝ අනාවරණය කිරීම සිදු කර ඇත.

# 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

## 3.1 වත්කම් හා ඒවායේ අගය කිරීම් සඳහා පදනම්

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ වත්කම් යනු මුදල් හා සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී හෝ වාර්තා කරන දිනයේ සිට වසරක කාල පරිච්ඡේදයක් ඇතුළත යන දෙකෙන් අඩු කාලය තුළ මුදල් බවට පත් කරනු ලබන වත්කම් වේ. වාර්තා කරන දිනයේ සිට වසරක කාලයකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් සඳහා සමාගමට රඳවා ගැනීමට සිදුවන වත්කම් ජංගම නොවන වත්කම් වේ.

### 3.1.1 දේපළ, පිරියත හා උපකරණ

#### 3.1.1.1 හඳුනා ගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත (හෝ කල්බදු හිස් ඉඩම් නම් ඒවායේ තක්සේරු වටිනාකමට) සමුච්චිත ක්ෂය වෙන් කිරීම් හා අපහරණයන් සිදුවී ඇත්නම් එහි අලාභය අඩු කිරීමෙන් පසු දක්වයි.

**(අ) සන්තක දේපළ**

දේපළ, පිරියත හා උපකරණ ඒවා අත්පත් කර ගැනීමේ දී දැරූ සෘජු පිරිවැයයි. සමාගම විසින් ඉදිකරන ලද වත්කමක් නම් එම වත්කම අදාළ කාර්යයට සුදුසු තත්ත්වයට ගෙන ඒම දක්වා දැරූ සියලු පිරිවැය, එනම් ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා ඒ සඳහා සෘජුව දායකවිය හැකි වෙනත් වියදම් ඇතුළත් වේ. උපකරණ ක්‍රියාකාරීත්වයට අදාළව මිලදී ගත් මෘදුකාංග අදාළ උපකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපළ, පිරියත හා උපකරණවල යම් කිසි සුවිශේෂ කොටස් යම් කාල සීමාවල දී මාරු කිරීම් සිදුකරන අවස්ථාවල දී පිළිවෙලින් එම කොටස් ඵලදායී ආයු කාලයක් හා ක්ෂය කළ හැකි තනි ඒකක වශයෙන් සලකා කටයුතු කරයි. එසේම සැලකිය යුතු අන්දමින් පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවලදී හඳුනා ගැනීමේ නිර්ණායකයන් සපුරා ඇත්නම් එහි පිරිවැය දේපල පිරියත හා උපකරණවල ප්‍රතිෂ්ඨාවක් ලෙස ධාරණ අගයට එකතු කිරීමක් ලෙස හඳුනා ගනු ලැබේ. අනිකුත් සියලුම අලුත්වැඩියා හා නඩත්තු විස්තීරණ ප්‍රකාශනයේ වියදම් ලෙස දැක්වේ. නොනිමි ප්‍රාග්ධනය, ඊට අදාළ

වත්කම්වලට මාරු කරනු ලබන්නේ එහි ප්‍රථම භාවිතයේදී හෝ වත්කම් ක්‍රියාත්මක කරන අවස්ථාවේදීමය. ප්‍රාග්ධන නොනිමි වැඩ පළමු උපයෝජනයේ දී හෝ වත්කම ආරම්භ කරන වේලාවේ දී එක් එක් වත්කම් ගිණුම්වලට මාරු කරනු ලැබේ.

**(ආ) කල්බදු වත්කම්**

මූල්‍ය කල්බදු යටතේ ලබාගත් දේපළ, පිරියත හා උපකරණ ( බදු ගත් භාණ්ඩය හිමිකර ගැනීමෙන් සමාගමට අවධානමක් හෝ වාසියක් සෘජුවම ලැබෙන්නේ නම්) ඒවායේ සාධාරණ වටිනාකම හා අවම කල්බදු ගෙවීම් වල කල් බද්ද ආරම්භයේ තීරණය කරන ලද වර්තමාන වටිනාකමට සමාන අගයන්ගෙන් අඩු අගය මත ප්‍රාග්ධනිතකරණය කර සමාගම විසින් එම වත්කම් භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලපරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කර දක්වයි.

බදුකරුට ගෙවීමට ඇති ප්‍රාග්ධන වටිනාකමට සමාන ප්‍රමාණය වගකීම් ලෙස පෙන්වා ඇත. එක් එක් මූල්‍ය වර්ෂයේදී ගෙවන බදු වාරිකය තුළ අන්තර්ගත පොළී ප්‍රමාණය එක් එක් වර්ෂයේ වියදමක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ දක්වයි. මෙයින් එකම අනුපාතයක් යටතේ සෑම වර්ෂයක් අවසානයේම පවතින බදු වගකීම් ශේෂයට පොළී ගණනය වීම සිදුවේ.

බදු දේපළ වැඩි දියුණු කිරීම සඳහා කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කර ඉතිරි බදු කාලය හෝ ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය හෝ යන දෙකෙන් අඩු කාල පරිච්ඡේදය තුළ ක්ෂය කරනු ලබයි.

**3.1.1.2 පසුකාලීන පිරිවැය**

දේපළ, පිරියත හෝ උපකරණයක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේදී දරණ පිරිවැය එම කොටස පවත්වාගෙන යන ප්‍රමාණය, එම කොටසෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එනු ඇති බව සහ එය විශ්වාසනිය ලෙස මැනීමට හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගනු ඇත. ප්‍රතිෂ්ඨාපනය කරන ලද කොටස් වල ධාරණ අගය පහත දක්වා ඇති ප්‍රතිපත්තීන්ට අනුව හඳුනා ගැනීම ඉවත් කිරීම ලෙස හඳුන්වයි. දේපළ, පිරියත සහ උපකරණ වලට දෛනිකව කරන නඩත්තු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගැනේ.

**3.1.1.3 හඳුනා ගැනීම ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීමේ දී හෝ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නැතැයි හැගෙන අවස්ථාවලදී එය වත්කමක් ලෙස හඳුනා නොගනී. ඒ තුළින් ලැබෙන ලැබීම් හා පාඩු, ලාභ හෝ පාඩු වශයෙන් සළකන අතර ප්‍රතිලාභ අයභාරය ලෙස වර්ගීකරණය නොකරයි.

**3.1.1.4 ක්ෂයවීම සහ ක්‍රමක්ෂය**

**(අ) ක්ෂයවීම්**

ක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගන්නා අතර දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය මත පදනම්ව ඒ එක් එක් දේපළ, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්ෂය ගණනය කරනු ලැබේ. වර්තමානයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත පරිදි වේ.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| ගොඩනැගිලි | 40 | 2.50 |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 15 | 6.67 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10 | 10.00 |
| මෝටර් රථ | 05 | 20.00 |
| උපකරණ | 08 | 12.50 |
| ස්ථිර ඉඩම් සංවර්ධනය | 30 | 3.33 |
| වැටවල් | 03 | 33.33 |
| ජල සැපයුම | 20 | 5.00 |

වත්කම් ක්ෂයවීම එය භාවිතය සඳහා ගත් අවස්ථාවේ ආරම්භ වී එය අලෙවි සඳහා තබා ඇති බවට හෝ වත්කමක් ලෙස හඳුනා නොගන්නා බවට වර්ගීකරණය කර ඇති දිනයේ දී අවසන් වේ. ක්ෂය ක්‍රමය ඵලදායී ජීවිත කාලය හා ශේෂ වටිනාකම් වාර්තාකරන දිනයේ දී අවශ්‍ය වන්නේ නම් නැවත තක්සේරු කරනු ලබයි

**(ආ) ක්‍රමක්ෂය**

කල්බදු කාලය අවසන් වීමත් සමඟම නිශ්චිතවම වත්කමේ හිමිකරු වන බව දන්වා විට හැරෙන්නට කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාලය හෝ ඵලදායී ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. ජනවසමෙන් බදු ගත් වත්කම්වල බදු කාලය 2045 න් අවසන් වනු ඇත.

ජනවසම මඟින් අත්කර ගත් වත්කම්වල බදු අයිතිය ඉතිරි බදු කාලය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය යන දෙකෙන් අඩු කාලය තුළ සමාන කොටස්වලින් ක්‍රමක්ෂය කරනු ලබන අතර වර්තමාන ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත දැක්වෙන පරිදි වේ.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| හිස් ඉඩම් සඳහා කල් බදු අයිතිය | 53 | 1.89 |
| ඉඩමේ වැඩි දියුණු කිරීම | 30 | 3.33 |
| වෙනත් හිමි වූ වත්කම් | 30 | 3.33 |
| ගොඩනැගිලි | 25 | 4.00 |
| යන්ත්‍රසූත්‍ර | 15 | 6.67 |
| ජල සැපයුම | 20 | 5.00 |

### 3.1.2 ජීව විද්‍යාත්මක වත්කම්

### 3.1.2.1 නොමේරූ හා මේරූ වගාවන්

**(අ) නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමේරූ හා මේරූ වගා)**

වැවිලි වතු පෞද්ගලීකරණය කරන අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ UITF රීති නියමයන්ට අනුව ජනවසම වතුයායවල මූල්‍ය කල්බදු යටතේ නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමේරූ හා මේරූ වගාවන්) 1992 ජුනි 22 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ ගිණුම්වලට ගෙන ඇත.

කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් සරල මාර්ග පදනම යටතේ විස්තීරණ මූල්‍ය ප්‍රකාශනය තුළ වර්තමාන සහ ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය පුරා සංසන්දනාත්මකව පහත සඳහන් ආකාරයට ක්‍රමක්ෂය කර ඇත.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| මේරූ වගාව | 30 | 3.33 |

**(ආ) කල්බදු දේපළ සංවර්ධනය කිරීම (නොමේරූ හා මේරූ වගා)**

වගා කරන කාලය තුළ එනම්, භූමිය සකස් කිරීම, පුනරුත්ථාපනය, අලුත් වගා කිරීම, නැවත වගා කිරීම, අන්තර් වගා කිරීම් සහ නව වගා සඳහා පොහොර යෙදීම ආදියේ සිට අස්වැන්න නෙළීම දක්වා (වගා කර ඇති ප්‍රදේශ වසර 8 කට පසු මේරූ තත්ත්වයට පත් වන තුරු) වූ පිරිවැය නොමේරූ වගා යටතට ගැනේ. මෙම නොමේරූ වගා සෘජු පිරිවැය සහ අන්තර්ග්‍රහනය කරන ලද පොදු කාර්ය පිරිවැයවලින් සමන්විත වේ. පවත්වාගෙන යන ජීව විද්‍යාත්මක වත්කම් (උදා: පොල්) වෙනුවෙන් දරණ ලද වියදම ඵල දරණ බවට පත් වන වර්ෂයේදී මේරූ වගාවන්ට මාරු කරනු ලබයි.

කල්බදු ඉඩම් සංවර්ධනය ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සරල මාර්ග පදනමට අනුකූලව බදු කාලය අවසන් වීමට ඇති කාලය හෝ සංවර්ධනයේ ඵලදායී ආයු කාල සීමාව හෝ, දෙකෙන් අඩු එක ලෙස හඳුනා ගනු ඇත.

ඇස්තමේන්තු ගත වර්තමාන සහ සංසන්දනාත්මක ඵලදායී ආයු කාලය පහත දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට

| | වසර ගණන | අනුපාතිකය % |
|---|---|---|
| පොල් | 50 | 2.00 |
| කජු | 25 | 4.00 |
| වෙනත් | 20 | 5.00 |

**(ඇ) පාරිභොජ්‍ය ජෛව වත්කම්**

පරිභෝජනය කළ හැකි දැව ගස් හඳුනා ගැනීමේදී මිණුම් කරන අතර එක් එක් වාර්තා කරන කාලසීමාව අවසානයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 අනුව විකිණීමේ පිරිවැය අඩු කොට සාධාරණ අගයට ගණනය කරයි. දැව ගස් වල සාධාරණීය වටිනාකම ගණනය කරනු ලබන්නේ වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය (DCF) යොදා ගනිමිනි.

නොමේරූ ගස්වල පිරිවැය සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි.

| | |
|---|---|
| මුදල් ඒකකය | ශ්‍රී ලංකා රුපියල් |
| දැව පරිමාව | විවිධ ප්‍රදේශයන්හි එක් එක් දැව විශේෂයන් හි දැඩි බව උස සහ වර්ධනය සැලකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සිදු කරයි. |
| ආර්ථික ඵලදායි කාලය | සමාගමේ වන වගා සැලසුම අනුව එක් එක් දැව විශේෂයන් හි සාමාන්‍ය ආයු කාලය තීරණය කරනු ලබයි. |
| විකුණුම් මිල | පවතින ශ්‍රී ලංකා වෙළඳපොළ මිල අනුව ඇස්තමේන්තු සිදු කෙරේ. |
| වට්ටම් අනුපාතය | අනාගත මුදල් ප්‍රවාහයන් පහත දැක්වෙන වට්ටම් අනුපාතයන් අනුව වට්ටම් ගත කෙරේ. දැව ගස් 14% |

**3.1.2.2 ගව පශු සම්පත**

ගව පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි. ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව පශු සම්පත් සාධාරණ අගය තීරණය කරනු ලැබේ.

**3.1.3 විකිණීමට ඇති ජංගම නොවන වත්කම්**

අඛණ්ඩ භාවිතයට වඩා මූලිකව විකිණීම තුළින් අයකර ගැනීමට බලාපොරොත්තු වන ජංගම නොවන වත්කම් විකිණීම සඳහා වෙන්කර ඇති දෑ ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීමට තබා ඇති වත්කම් එසේ කිරීමට ආසන්නතම අවස්ථාවේ ඒවායේ ධාරණ අගය හෝ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර ලැබෙන අගය යන දෙකෙන් අඩු අගයසේ සැලකේ. පවතින තත්වයෙන්ම විකිණීමේ ඉහළ සම්භාවිතාවක් ඇති ජංගම නොවන වත්කම් විකිණීමට ඇති දෑ ලෙස වර්ගීකරණය කරනු ඇත.

"විකිණීමට වෙන්කර ඇති දෑ" ලෙස වර්ගීකරණය කළ දේපළ, පිරියත හෝ උපකරණ ක්ෂය කිරීමට හෝ ක්‍රමක්ෂය කිරීමකට භාජනය නොවේ.

**3.1.4 තොගය**

තොග පිරිවැය හා ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම මත යල්පැනුම් හා මන්දගාමීව අලෙවි වන ද්‍රව්‍ය සඳහා අවශ්‍ය වෙන් කිරීම් සිදු කිරීමෙන් පසුව අගයන්ගෙන් අඩු අගය මත ගණනය කර දක්වා ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු උපලබ්ධි පිරිවැය ප්‍රතිපාදන සලසා හා/හෝ දැනට පවත්නා තත්ත්වයෙන් විකිණිය හැකි තත්ත්වයට පරිවර්තන සිදු කර සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රමවේදය අනුව තොග විකිණිය හැකි මිල ගණන්ය.

තොගය වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒම සඳහා දැරූ පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කර ගණනය කරනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන්**
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට

| පාරිභෝජන සහ අමතර ද්‍රව්‍ය යෙදවුම් | පෙර ලැබීම් පෙර නිකුත් පදනම මත සත්‍ය පිරිවැය |
|---|---|
| පැළ තවාන් සහ බෝග වැවීම | සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය පිරිවැය හා සෘජුව ආරෝපණය කළ හැකි පොදු කාර්යය පිළිබඳ යෝග්‍ය සමානුපාතික පිරිවැය. |
| නෙළාගත් අස්වැන්න | ජීව විද්‍යාත්මක වත්කම්වලින් නෙලා ගත් කෘෂි නිෂ්පාදන ඒවායේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර නෙලාගත් අවස්ථාවේ අගය කරයි.<br><br>අර්ධ නිමි සහ නිමි කෘෂිකාර්මික තොග අගය කිරීමේදී කෘෂි නිෂ්පාදනවල සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කර අගය කරයි. |
| පශු සම්පත් | කිරි පශු සම්පත් තොග මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කිරීමෙනි.<br><br>කිරි පශු සම්පතේ සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුව තීරණය කරනු ලැබේ. |

### 3.1.5 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (LKAS39) යටතට ගැනෙන මූල්‍ය වත්කම් ලෙස, ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්, ණය හෝ ලැබිය යුතු දෑ හෝ, කල්පිරෙන තෙක් තබා ගෙන ඇති ආයෝජන හෝ විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස දැක්විය හැක. සමාගම එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මුල් හඳුනාගැනීමේ දී තීරණය කරනු ලැබේ. සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම මත ද ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම අනුව නොමැති වත්කම් සම්බන්ධව වන විට සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය හරහා හඳුනා ගනු ලැබේ.

මුදල්, කෙටි කාලීන තැන්පතු හා ආයෝජන, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය ආයතනවලට ලබා දුන් ණය සමාගමේ මූල්‍ය වත්කම්වලට ඇතුළත් වේ.

#### 3.1.5.1 ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

වෙළඳාම සඳහා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට මූලිකව හඳුනාගත් මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම්වලට ඇතුළත් වේ. මූල්‍ය වත්කම් අලෙවි කර්යය සඳහා අත්කර ගත්තේ නම් හෝ ආසන්න කාලයකින් නැවත මිලදී ගත්තේ නම් ඒවා වෙළඳාම සඳහා රඳවා ගත් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම යටතේ සාධාරණ වටිනාකමට සුදුසු වෙනස්කම් හඳුනාගන්නා අතර සාධාරණ වටිනාකම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වේ.

සමාගම ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම අනුව මූලික අවස්ථාවේ දී කිසිදු මූල්‍ය වත්කමක් නම් කර නැත.

#### 3.1.5.2 ණය හා ලැබිය යුතු දෑ

ණය හා ලැබිය යුතු දෑ යනු ස්ථාවර හෝ නිශ්චිත වාරික ගෙවීම් සහිත ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ මිල තීරණය නොවූ, ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් වේ.

මූලිකවම සාධාරණ වටිනාකම හා අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම මත සෘජුව හඳුනා ගන්නා ගනුදෙනු පිරිවැය සමඟ හඳුනා ගනී. පසුව සඵල පොළී අනුපාත ක්‍රමය මත අපහායනයන් අඩු කර ක්‍රමක්ෂය කර පවත්වා ගනී.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ වට්ටම් අත්පත් කර ගන්නා අවස්ථාවේ වූ අධි මිල ගාස්තු හෝ යම් වියදමක් වුයේ නම් ඒවා සඵල පොළී අනුපාත ක්‍රමයේ සංගටනීය කොටස ලෙස සැලකිල්ලට ගැනීමෙනි.

සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇති මූල්‍ය ආදායම්වල ඇතුලත් වේ. හානිකරණය වීමෙන් මතුවන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇති මූල්‍ය පිරිවැයවල හඳුනා ගෙන ඇත.

වෙළඳ ලැබිය යුතු දෑ, සම්බන්ධිත පාර්ශවවලින් ලැබිය යුතු මුදල්, තැන්පතු, අත්තිකාරම් හා වෙනත් ලැබිය යුතු දෑ, මුදල් හා සමාන දෑ වලට ඇතුලත් වේ.

**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ පහත සඳහන් අවස්ථාවන් හැර, ප්‍රථමයෙන් එහි සාධාරණ අගය මත හඳුනා ගනී. පසුව ක්‍රමක්ෂය වටිනාකමෙන් හානිකරණයක් සිදුවී ඇත්නම් ඒ සඳහා වෙන් කිරීම් සිදු කර පවත්වා ගනී.

සම්බන්ධිත පාර්ශවයන්ට, පොළී රහිත හා නැවත ගෙවීමේ දී නිශ්චිත කොන්දේසි රහිතව ලබා දෙන ලද ණය පිරිවැයෙන්, හානිකරණයන් සිදුවී ඇත්නම් ඒ සඳහා අඩමාන හා බොල් ණය ප්‍රතිපාදනය සිදු කර මනිනු ලබයි.

ප්‍රකාශිත පොළී පදනමක් රහිත සහ වට්ටම් බලපෑමකින් තොරව කෙටි කාලීන ලැබිය යුතු දෑ ඉන්වොයිස් වටිනාකම මත හානිකරණය සඳහා වෙන් කිරීම් සිදු කළ යුතු වීම බොල් හා අඩමාණ ණය සඳහා වූ ප්‍රතිපාදනයන්ට යටත්ව මනිනු ලබයි.

**මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශන තුළ මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් , ස්ථාවර තැන්පතු හා ඉතුරුම් තැන්පතු ද ඇතුළත් වේ.

### 3.1.5.3 කල්පිරීමට තිබෙන ආයෝජන

සමාගමට ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත හා ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් කල්පිරීම් වන තෙක් තබා ගැනීමට අදහසක් හා හැකියාවක් තිබෙන්නේ නම් ඒවා කල්පිරීමට තබාගත් මූල්‍ය වත්කම් ලෙස වර්ග කරනු ලැබේ. මූලික ඇගයීමෙන් පසු කල්පිරීමට තබාගත් ආයෝජන සඵල පොළී ක්‍රමය යොදා ගෙන ක්‍රමක්ෂය පිරිවැයෙන් හානිකරණයන් වී ඇත්නම් අඩු කර ඇගයීම් කරනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ දක්වා ඇත. හානිකරණය තුළින් ඇති වන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනා ගෙන ඇත. 2017 වර්ෂය සඳහා කල්පිරීමට නියමිත ආයෝජන ලෙස රු. 190,312,100/- කෙටිකාලීන ආයෝජන යටතේ පෙන්වා ඇත. (2016 වර්ෂයේ රු. 140,868,261/- )

### 3.1.5.4 අලෙවියට ඇති මූල්‍ය ආයෝජන

අලෙවියට ඇති මූල්‍ය වත්කම් යනු අලෙවියට ඇති ලෙස නම් කර ඇති හා ඉහත වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් නොවන ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව ඒවායේ වෙනස්වීම් හා සාධාරණ වටිනාකම මත අගයනු ලබයි. ඒ හැර හානිකරණය වීම වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගන්නා අතර සධාරණ වටිනාකමේ වැඩිවීම ස්කන්ධය සහ සංචිත යටතේ ඉදිරිපත් කරනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගෙන අලෙවියට ඇති ණය සුරකුම්පත්වල පොළී ආදායම ගණනය කරනු ලබන අතර ලාභ හෝ අලාභ මත හඳුනාගනු ලැබේ. ආයෝජන හඳුනා ගැනිමෙන් ඉවත් කරන විට ස්කන්ධය තුළ ඇති සමුච්චිත ලාභ හෝ අලාභ, ලාභ අලාභ ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබේ. 2017 වසර තුළ සමාගමේ අලෙවියට ඇති මූල්‍ය ආයෝජන නොමැත (2016 - ශූන්‍ය).

### 3.1.5.5 මූල්‍ය වත්කම් හානිකරණය වීම

මූල්‍ය වත්කම් හානිකරණය වී තිබේ ද යන්න පිළිබඳ කිසියම් විෂය මූලික සාක්ෂි තිබේදැයි සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම ඇගයීම් කරනු ලබන අතර එවැන්නක් සිදු වී ඇත්තේ නම් වත්කම ධාරණ අගය සහ අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය අතර වෙනස අනුව අලාභය ගණනය කරයි.

## 3.2 වගකීම් හා වෙන් කිරීම්

මූල්‍ය තත්ව ප්‍රකාශන ඉදිරිපත් කරන දිනයේ සිට වසරක කාලයක් ඇතුළතදී ගෙවිය යුතු හෝ ඉල්ලූ විටදී ගෙවිය යුතු හෝ බැරකම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත. මූල්‍ය තත්ව ප්‍රකාශයේ දින සිට වසරකට පසුව ගෙවිය යුතු බැරකම් ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුනා ගත් සියලුම දන්නා වගකීම් සහ බැරකම් ගිණුම් ගත කර ඇත. අතීත හේතූන් මත සමාගම වෙත පැවරී ඇති නෛතික හා සාධනීය බැඳීම් හඳුනා ගෙන ඒවා පියවීම සඳහා මූල්‍ය කැප කිරීමක් අවශ්‍ය වන නීතිමය බැඳීම් පවතින්නේ නම් ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය වෙන් කිරීම් සිදු කරයි.

### 3.2.1 මූල්‍ය වගකීම්

**මූලික හඳුනා ගැනීම හා ඇගයීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 39 ට අනුව මූල්‍ය වගකීම් ලෙස ලාභ හෝ අලාභ අලාභ මත සාධාරණ අගයට ඇති මූල්‍ය වගකීම, ණය හා ණයට ගැනීම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගම එහි මූල්‍ය වගකීම් වර්ගීකරණය මුල් හඳුනා ගැනීමේ දී තීරණය කරනු ලැබේ. සියලුම මූල්‍ය වගකීම් මුල් අවස්ථාවේ දී සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර ණය හා ණයගැනීම් ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගනී. ඍජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ.

සමාගමේ මූල්‍ය වගකීම් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ තුළ ඇතුලත් වේ.

#### 3.2.1.1 සාධාරණ අගය මත ලාභ හෝ අලාභ හරහා මූල්‍ය වගකීම්

ගනුදෙනු කිරීම සඳහා ඇති මූල්‍ය වගකීම් හා සාධාරණ අගය මත ලාභ හෝ අලාභ හරහා මූලිකව හඳුනාගත් මූල්‍ය වගකීම් සාධාරණ අගය මත ලාභ හෝ අලාභ හරහා ඇති මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ. මූල්‍ය වගකීම් ආසන්න කාලයකින් අලෙවි කාර්යය සඳහා රඳවා ගත්තේ නම් ඒවා ගනුදෙනු සඳහා රඳවා ගත් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ගනුදෙනු සඳහා රඳවා ගත් වගකීම්වල ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී. සාධාරණ අගය මත ලාභ හෝ පාඩු මත මූල්‍ය වගකීම් කිසිවක් සමාගම සතුව නැත.

#### 3.2.1.2 ණය හා ණයට ගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් පසුව පොළී සහිත ණය හා ණයට ගැනීම් සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගෙන ක්‍රමක්ෂ පිරිවැයට අගයනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රම ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා ගන්නා විට මෙන්ම ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. අනෙකුත් මූල්‍ය වගකීම් තුළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හා ගෙවිය යුතු ආදායම් බදු ඇතුළත් වේ.

### 3.2.2 මූල්‍ය අවදානම් කළමනාකරණ පරමාර්ථ හා ප්‍රතිපත්ති

වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හා ගෙවිය යුතු ආදායම් බදු සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම් වලට ඇතුලත් වේ. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් සඳහා මුදල් යෙදවීමයි. සමාගම විසින් රජයේ ව්‍යාපාර සඳහා ණය ලබා දී ඇති අතර වෙළෙඳාම හා අනෙකුත් ලැබිය යුතු දෑ හා මුදල් හා කෙටි කාලීන තැන්පතු සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඍජුවම ලඟාවී ඇත.

ඒ අනුව සමාගම මූල්‍ය මෙවලම් භාවිතයේදී ණය අවදානම්, ද්‍රවශීලතා අවදානම්, ව්‍යවහාර මුදල් අවදානම් සහ පොළී අනුපාත අවදානම් ආදියට මුහුණ පානු ඇත. මෙම සටහන සමාගම මුහුණපාන එම අවදානම් ගැන තොරතුරු සපයන අතර ඒවා කළමනාකරණය පිණිස සමාගමේ අරමුණු සහ ප්‍රතිපත්ති මගින් පැහැදිලි කරයි.

**3.2.2.1 ණය අවදානම**

ණය අවදානම යනු සමාගම විසින් ණය සපයා ඇති පාරිභෝගිකයෙක් හෝ පාර්ශවයක් සාධන පත්‍ර තම ගිවිසුම්, බැඳීම් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ විට සමාගමට ලැබිය යුතු දෑ නොලැබීමෙන් ඇති වන මූල්‍ය අලාභයයි.

**3.2.2.2 ද්‍රවශීලතා අවදානම**

සමාගමට මුදල් හෝ අනෙකුත් මූල්‍ය වත්කම් මගින් පියවීමට ඇති එහි මූල්‍ය වගකීම් ආශ්‍රිත බැඳීම් ඉටු කිරීමේ දී මතු වන දුෂ්කරතා ද්‍රවශීලතා අවදානම් වේ.

සමාගමට සාමාන්‍ය හා පීඩාකාරී තත්වයන් තුළ සමාගමේ කීර්තියට හානියක් නොමැතිව වෙනත් අලාභ ඇති නොවන ආකාරයෙන් හැකි තාක් දුරට සෑම විටම සිය වගකීම් පියවිය හැකි ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සතුව තිබීම මෙම අවදානම කළමනාකරණය කිරීමේ ප්‍රවේශයක් වේ.

**3.2.3 සේවක ප්‍රතිලාභ**

**(අ) නිර්වචිත දායක සැලසුම් - අර්ථ සාධක අරමුදල හා භාරකාර අරමුදල**

නිර්වචිත දායක සැලසුම් යනු අස්තීත්වයක් විසින් වෙනත් අස්තීත්වයකට (අරමුදලකට) ස්ථාවර දායක මුදල් ගෙවනු ලබන සහ තව දුරටත් දායක මුදල් ගෙවීමට නිතිමය හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් ඇති නොවන පශ්චාත් සේවා සැලසුම් වේ. සේවකයින් විසින් ලබා දෙන සේවය වෙනුවෙන් අදාළ කාලයට සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා භාරකාර අරමුදලට සියලුම සේවකයින් සඳහා කරනු ලබන ගෙවීම් වියදමක් සේ ලාභ අලාභ ප්‍රකාශනයේ සැලකේ.

සමාගම සේවකයින්ගේ දළ වැටුපෙන් 12% ක් හා 3% පිළිවෙලින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා භාරකාර අරමුදලට මාසිකව දායකත්වය දරනු ලබයි.

**(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම**

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම යනු නිර්වචිත දායක සැලසුම් හැර අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වේ. නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය ගණනය කිරීමේ දී ආයු ගණන අගය කිරීම (Actuarial Valuations) පදනම භාවිත කරයි. ආයු ගණක අගය කිරීමේ දී වට්ටම අනුපාතය අනාගත වැටුප් වැඩිවීම වැනි කල්පිතයන් ඇති කර ගනී. මෙම බැඳීම් දිගුකාලින නිසා එවැනි ඇස්තමේන්තු සැලකිව යුතු අවිනිශ්චිත තාවයකට ලක්වේ. භාවිත කළ කල්පිතයන් පිළිබඳ විස්තර 16 වැනි සටහනේ දැක්වේ. ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු මගින් අරමුදල් වෙන්කර ඇත.

## 3.3 විලම්බිත ආදායම

**ප්‍රදාන හා සහනාධාර**

නිශ්චිතව ලැබෙතැයි විශ්වාස කළ හැකි රාජ්‍ය ප්‍රදාන ඊට අදාළ කොන්දේසි සහිත වනු ඇත. ප්‍රදාන වියදමකට සම්බන්ධ විට දැරීමට බලාපොරොත්තු වන පිරිවැය අනුව ක්‍රමානුකූල පදනමක් මත අදායමක් සේ ගැනේ එම ප්‍රදානය වත්කමකට අදාළ නම් එය වත්කමේ අපේක්ෂිත ආයු කාලය තුළ සමාන වාරික විලම්භිත ආදායමක් සේ වෙන් කෙරෙනු ඇත.

ප්‍රදාන, දේපළ, පිරියත හෝ උපකරණ සඳහා නම් එම ප්‍රදානය දේපළ, පිරියත හෝ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පුරා විලම්භිත ආදායමක් සේ ක්‍රමානුකූල පදනමක් මත ගනු ලබයි.

වත්කම් ඒවායේ ඵලදායී ආයු කාලය හෝ පියවීමට ඇති කල්බදු කාලය යන දෙකෙන් අඩු එකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| ජල සැපයුම් | වසර 20 |
| මෝටර් රථ | වසර 05 |
| ගෘහ භාණ්ඩ හා මෙවලම් | වසර 10 |
| උපකරණ | වසර 08 |

## 3.4 ආදායම හා වියදම්

ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා වියදම් ශ්‍රිතය මගින් සමාගමේ කාර්ය සාධනය පිළිබඳ මූලිකාංග වැඩියෙන් නියෝජනය කරනු ලබන බැවින් එම ක්‍රමය යොදා ගනු ලැබීය.

### 3.4.1 ආදායම

අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිශ්චිත වන විට හා විශ්වසනීය ලෙස මැනිය හැකි විට වේලාව නොසලකා අයභාරය හඳුනා ගනී. ලැබූ ප්‍රතිෂ්ඨාවේ හෝ ලැබිය යුතු දෑ වල සාධාරණ වටිනාකම මත බදු හැර ගිවිසුම්ගත ගෙවීම් නියමයන් සැලකිල්ලට ගෙන ආදායම මැනිය හැකිය.

(අ) භාණ්ඩ අලෙවියෙන් ලබන අයභාරය හඳුන්වන්නේ යම්කිසි භාණ්ඩයක හිමිකම සහ ළඟ තබා ගැනීමේ ප්‍රතිලාභය සහ අවදානම භාණ්ඩ විසර්ජනය තුළින් ගැණුම්කරු වෙත මාරු කිරීමෙනි. අයභාරය වාර්තා කරන්නේ ඉන්වොයිස් වටිනාකමින් තැරුව් ගාස්තු අලෙවි වියදම් හා අයභාරයට අයත් වෙනත් ගාස්තු අඩු කිරීමෙනි.

(ආ) දේපළ, පිරියත හා උපකරණ අපහරණයෙන් ලැබෙන ලාභ හා අලාභ ගණනය කරන්නේ ශුද්ධ විකුණුම් අගය හා දේපළ, පිරියත හා උපකරණ ධාරණ අගය සංසන්දනය කිරීමෙනි. වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

(ඇ) පොළී ආදායම LKAS 39 යටතේ සඵල පොළී ක්‍රමය භාවිතයෙන් හඳුනාගනී.

(ඈ) වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගනී.

### 3.4.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී දරන සියලු වියදම් හා සියලු දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම මට්ටමේ පවත්වාගෙන යාම සඳහා දැරූ සියලු වියදම් වර්ෂයේ ලාභ/අලාභ ගණනය කිරීමේ දී අයභාරයට එරෙහිව පෙන්වයි.

## 3.5 ආදායම් බදු

අයබදු, වර්තන බදු, සහ විලම්භිත බදු යන දෙකොටසකින් සමන්විතයි. ස්කන්ධයට සම්බන්ධිත ස්කන්ධය මත හඳුනා ගන්නා අයිතමය හැර ආදායම් බදු වියදම් ලාභ අලාභ ප්‍රකාශයේ හඳුනා ගනියි.

**(අ) වර්තන බදු**

වර්තන බදු යනු වාර්තාකරණ දිනයේ දී බදු අනුපාතිකය යොදා ගෙන වසර සඳහා බදු ගෙවිය යුතු ආදායම මත ගෙවිය යුතු බද්ද හා පසු ගිය වර්ෂ වලට අදාලව ගෙවිය යුතු බද්දට කළ කිසියම් ගැලපුම් වේ. මූල්‍ය වාර්තාවල සඳහන් ආදායම් වියදම් මූලිකාංග පදනම් කර ගනිමින් හා දේශීය ආදායම් පනතේ හා එහි සංශෝධනයන්ට අනුව ආදායම් බදු සඳහා වෙන් කිරීම සිදුකරයි.

**(ආ) විලම්බිත බදු**

ශේෂ පත්‍ර ක්‍රමය භාවිතයෙන් මූල්‍ය වාර්තාකරන කාර්යයන් සඳහා වත්කම් සහ වගකීම් වල පවත්වාගෙන යන වටිනාකම සහ බදුකරණ කාර්යය සඳහා යොදා ගත් වටිනාකම් අතර තාවකාලික වෙනස සැලකිල්ලට ගෙන විලම්බිත බදු හඳුනාගනී. පහත දැක්වෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනා නොගනී. ව්‍යාපාර ඒකාබද්ධ වීමක් නොවන හා ගිණුම්කරණ හෝ බදු අයකරන ලාභයට බලපෑමක් නොකරන ගනුදෙනුවක වත්කම් හා වගකීම් මූලික හඳුනා ගැනීම සහ පරිපාලිත වල කරනු ලබන ආයෝජන අනාගතයේ දී අවලංගු නොකරනතාක් දුරට ඒවායේ වෙනස්කම්. මෙයට අමතරව කීර්තිනාමය මූලික හඳුනා ගැනීම මත පැන නගින බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනා නොගැනේ. පනවා ඇති නීති හෝ වාර්තාකරන දිනය මඟින් හරවත්ව පනවනු ලබන නීති පාදකව තාවකාලික වෙනස්කම් අවලංගු වන විට ඒවාට අදාළ වන බවට අපේක්ෂිත බදු අනුපාතික මත විලම්බිත බදු මනිනු ලැබේ. වර්තන බදු වගකීම් හිලව් කිරීමට නෛතික බලාත්මක අයිතියක් ඇත්තේ නම් හා එම බදු අයකළ හැකි සාමාන්‍ය ආදායම මත බදු අයකරනු ලබන අධිකාරිය විසින්ම පැනවූ ආදායම් බදු වලට ඒවා සම්බන්ධ වන්නේ නම් විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලව් කරනු ලැබේ. තාවකාලික වෙනස උපයෝජනය කළ හැකි ඒවා සම්බන්ධව අනාගත බදු අයකළ හැකි ලාභ ලබාගත හැකි වන ප්‍රමාණයට පමණක් විලම්බිත බදු වත්කමක් හඳුනාගනී. සෑම වාර්තා කරන දිනයක දීම විලම්බිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර අදාල බදු ප්‍රතිලාභ හඳුනාගත නොහැකි වන තාක් දුරට අඩු කරනු ලැබේ.

පරිපාලිත සමාගම් වල හා ආශ්‍රිත සමාගම්වල ලාභාංශ ආදායම මත රඳවාගත් බදු අදාළ ලාභාංශය ගෙවීමට ඇති වගකීම හඳුනාගන්නා වෙලාවේදීම ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

## 3.6 ඛණ්ඩ වාර්තාකරනය

සමාගමේ ව්‍යාපාර ඛණ්ඩ පිළිබඳ තොරතුරු ඛණ්ඩ වාර්තාකරණයෙන් පෙන්වයි. වගාවන් පිහිටා ඇති භූගෝලීය පිහිටීම පදනම් කර ව්‍යාපාර ඛණ්ඩනය කිරීම තීරණය කර ඇත. ඛණ්ඩන ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 19 මඟින් දක්වා ඇත. වැවිලි භූගෝලීය පිහිටීම පහතින් දක්වා ඇත.

| **සමූහ 01 වතු** | **සමූහ 02 වතු** |
|---|---|
| හලාවත වතු කලාපය | බිංගිරිය වතු කලාපය |
| පලුගස්වැව වතු කලාපය | දිවුලපිටිය වතු කලාපය |
| තම්බපණ්නි වතු කලාපය | මාදම්පේ වතු කලාපය |

## 3.7 වාර්තා කරන දින වනවිට නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන ප්‍රමිතීන්

වාර්තා කරන දින වනවිට නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන ප්‍රමිතීන් පහත දක්වා ඇත. ඒවා බලාත්මක වූ විට සමාගම ඒවා අනුගමනය කරනු ඇත. විස්තරාත්මක සමාලෝචනයක් කරන තුරු එහි මූල්‍ය බලපෑම, මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ නොහැක.

I) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 9 - මූල්‍ය සාධන පත්‍ර:**

LKAS 39 දැනට පවතින මූල්‍ය සාධන පත්‍ර SLFRS 09 මගින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

**හඳුනාගැනීම සහ ඇගයීම**

මූල්‍ය සාධන පත්‍ර වර්ගිකරණය හා මැනිම, මූල්‍ය වත්කම් හානිකරණය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ ආකෘතිය, සහ නව පොදු හෙජ් ගිණුම් කරන අවශ්‍යතා පිළිබඳ සංශෝධිත මග පෙන්වීමක් SLFRS 09 තුළ අන්තර්ගතය. එසේම LKAS 39 හි මූල්‍ය මෙවලම් හඳුනාගැනීම හා හඳුනා නොගැනීම පිළිබඳව තව දුරටත් මග පෙන්වීමක් සිදුකර ඇත. කලින් අනුගත කිරීම සඳහා අවසර සහිතව 2018 ජනවාරි 01 දිනට හෝ ඊට පසු ආරම්භ වන ගිණුම්කරන කාලච්ඡේදය සඳහා SLFRS 09 බලපැවැත්වේ.

### II) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 15 - ගනුදෙනු හඳුනා ගැනීම සමග ගිවිසුම් මත අයභාරය

කොපමණ මුදලක් කවදා අයභාරය ලෙස තීරණය කරනවා ද පිළිබඳ හඳුනාගැනීම සඳහා විස්තීරණ රාමුවක් ලෙස SLFRS 15 ස්ථාපිත කර ඇත. වර්තමානයේ අයභාරය හඳුනා ගැනීමට මග පෙන්වීමක් ලෙස ඇති LKAS 18 අයභාරය LKAS 11 කොන්ත්‍රාත් ගිවිසුම සහ IFRIC 13 ගනුදෙනුකරුවන් පක්ෂපාතීත්ව වැඩ පිළිවෙල, වෙනුවට මෙය හඳුන්වා දී ඇත. මෙම ප්‍රමිතිය 2018 ජනවාරි 01 දින හෝ පසුව ක්‍රියාත්මක වේ.

## 04. ජනවසම ඉඩම්වල කල්බදු අයිතිය

සියලු වතුවලට අදාළ වසර 53 කාලයක් සඳහා කල්බදු ගිවිසුම් අත්සන් කර ඇත. මෙම සියලු කල්බදු 1992 ජුනි 22 දින එනම්, සමාගම ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන ලෙස ක්‍රියාත්මක වේ. මෙම සියලු වතු වලට අදාල කල්බදු අයිතිය 1992 ජු නි 22 දින සමාගම පිහිටුවන ලද අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හදිසි කරුණු කාර්ය බලකාය මේ සම්බන්ධයෙන් ලබා දෙන නියමයන්ට හා විධිවිධානයන්ට අනුව සමාගමේ පොත් වලට ගෙන ඇත. මේ සඳහා 1995 මාර්තු 08 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම හිස් ඉඩම් සමාගම පිහිටුවීමට පෙර විශේෂඥ ඩී. ආර් වික්‍රමසිංහ සැකසූ වටිනාකම මත ප්‍රති ඇගයීමට තීරණය කර ඇත.

1992 ජුනි මස 22 දින මෙම වත්කම් ශේෂ පත්‍රයට ගෙන වසර 53 ක් පුරා සමාන වටිනාකමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. වාර්තාකරන දිනට ඉතිරි කල්බදු කාලය වසර 27.5 ක් වේ.

| | දළ පවත්වාගෙන යෑමේ අගය | |
|---|---|---|
| | 2017.12.31 දිනට රු. | 2016.12.31 දිනට රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | 142,502,287 | 142,502,287 |

| | ක්‍රමක්ෂය වීම | | |
|---|---|---|---|
| | 2017.12.31 දිනට රු. | වසර සඳහා රු. | 2017.01.01 දිනට රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | 68,702,304 | 2,688,722 | 66,013,582 |

| | පවත්වාගෙන යෑමේ අගය | |
|---|---|---|
| | 2017.12.31 දිනට රු. | 2016.12.31 දිනට රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | 73,799,983 | 76,488,705 |

**ගිණුම්කරණ සටහන්**
දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 05. ජනවසම වතුවල නිශ්චල කල්බදු වත්කම් ( භාවිතයට අයිතිය ඇති ඉඩම් සහ කල්බදු ජෛව වත්කම් හැර)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හදිසි කරුණු කාර්ය සාධක බලකායේ (UITF) නියමයට අනුව මෙම වතුවල ඇති මූල්‍ය කල්බදු යටතේ ඇති සියලුම නිශ්චල දේපල අතීතයේ සිට බල පැවැත්වෙන පරිදි 1992 ජුනි 22 වන දින සිට ක්‍රියාත්මක වන සේ සමාගමේ පොත් වලට ගෙන ඇත. වත්කම් ජනවසම පොත් වල සටහන් වටිනාකම් මත සමාගම ආරම්භ කළ දිනට පොත් වලට ගැනීමට 1995 මාර්තු 08 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තිරණය කර ඇත. මෙම වත්කම් 1992 ජුනි මස 22 දින ශේෂ පත්‍රයට ගෙන ඇති අතර නිශ්චල වත්කම් හා ක්‍රමක්ෂය 2017 දෙසැම්බර් 31 වන දිනට පහත දක්වා ඇත.

| තක්සේරුවේදි | ඉඩම් සංවර්ධනය රු. | වෙනත් අයිති වූ වත්කම් රු. | ගොඩනැගිලි රු. | යන්ත්‍ර සූත්‍ර රු. | ජල සැපයුම රු. | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනිත වටිනාකම | 841,193 | 1,002,944 | 25,356,498 | 530 | 4,026,236 | 31,227,401 | 31,227,401 |
| **ක්‍රමක්ෂය වීම** | | | | | | | |
| ජනවාරි 01 දා ට | 58,701,82 | 820,209,8 | 24,886,911 | 530 | 4,026,236 | 29,792,588 | 28,742,541 |
| වර්ෂයට ක්‍රමක්ෂය වීම | 2,390 | 33,397 | 438,521 | - | - | 474,308 | 1,050,047 |
| දෙසැම්බර් 31 දා ට | 61,092 | 853,606.8 | 25,325,432 | 530 | 4,026,236 | 30,266,897 | 29,792,588 |
| **පවත්වාගෙන යන වටිනාකම** | **780,101** | **149,337.3** | **31,066** | - | - | **960,504** | **1,434,812** |

## 06. කල්බදු යටතේ ඇති ජෛව වත්කම් (ජනවසම)

| ප්‍රත්‍යාගණනය | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| මේරූ වගාවන් | 83,080,009 | 83,676,574 |
| ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම් | (547,798) | (596,565) |
| | **82,532,211** | **83,080,009** |
| ජනවාරි 01 දා ට | 56,186,266 | 53,235,101 |
| වර්ෂයට ක්‍රමක්ෂය වීම | 2,766,565 | 3,437,873 |
| ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම් | (465,163) | (486,707) |
| දෙසැම්බර් 31 දා ට | **58,487,669** | **56,186,266** |
| පවත්වාගෙන යන වටිනාකම | **24,044,542** | **26,893,743** |

වතු කල්බදු යටතේ සමාගමට භාර දෙන අවස්ථාවේ නොමේරූ වගාවන් සඳහා කළ ආයෝජනය (1992-06-22 දිනට ප්‍රත්‍යාගණිත) නොමේරූ වගා ලෙස දක්වා ඇති අතර, වාර්තා කරන දින වන විට එවා සියල්ල මේරූ වගාවන්ට මාරු කර ඇත. තවද, සමාගම මේරූ සහ නොමේරූ වගාවන් වෙනුවෙන් සිදු කළ ආයෝජනයන් කල්බදු දේපල සංවර්ධන සටහන් අංක 7.2 යටතේ දක්වා ඇත. මෙම මේරූ/නොමේරූ වගාවන් LKAS 41 කෘෂිකර්ම නියමයන් යටතේ ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

**ගිණුම්කරණ සටහන්**
දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 07. ජෛව වත්කම් ( කල්බදු ජෛව වත්කම් හැර)

### 7.1 කල්බදු දේපල සංවර්ධනය (මේරූ සහ නොමේරූ වගා)

| පිරිවැය | නොමේරූ වගා රු. | මේරූ වගා පොල් රු. | කජු රු. | වෙනත් රු. | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|---|---|---|
| වර්ෂය ආරම්භයේදී | 472,088,652 | 190,413,296 | 87,056,399 | 5,792,859 | 755,351,206 | 669,003,078 |
| එකතු කිරීම් | 84,037,261 | - | - | - | 84,037,261 | 86,348,127 |
| නොමේරූ වලින් මාරු කිරීම | | 76,234,697.43 | - | - | 76,234,697 | 17,243,526 |
| මේරූ වලට මාරු කිරීම | (76,234,697) | - | - | - | (76,234,697) | (17,243,526) |
| ලියා හැරි ශේෂය | - | - | - | - | - | |
| වර්ෂය අවසානයේ දී | **479,891,215** | **266,647,993** | **87,056,399** | **5,792,859** | **839,388,467** | **755,351,206** |
| **ක්ෂයවීම** | | | | | | |
| වර්ෂය ආරම්භයේදී | | 26,617,751 | 26,586,326 | 507,661.39 | 53,711,738 | 46,373,076 |
| වර්ෂය සඳහා | | 3,861,957 | 3,482,256 | 289,642 | 7,633,855 | 7,338,662 |
| වර්ෂය අවසානයේ දී | | **30,479,708** | **30,068,581** | **797,303** | **61,345,593** | **53,711,738** |
| පවත්වාගෙන යන අගය | **479,891,215** | **236,168,285** | **56,987,817** | **4,995,556** | **778,042,874** | **701,639,467** |

**සටහන.**

මේවා සමාගම ස්ථාපිත කළ දින සිට මේරූ සහ නොමේරූ වගා සඳහා කළ ආයෝජනයි. කල්බදු යටතේ අත්පත් කර ගත් වත්කම් (වැවිලි වත්කම් ඇතුලත්ව) සටහන් අංක 4,5 සහ 6 යටතේ විදහා පෙන්වයි. තවදුරටත් කල්බදු පදනම යටතේ පවරාගන්නා ලද වත්කම් වල නොමේරූ වගාවන් වෙනුවෙන් කළ ආයෝජනයන් මෙම සටහන තුළ ඇතුලත් වේ. එවැනි වගා මේරූ තත්ත්වයට පැමිණි විට, මේරූ තත්ත්වයට ගෙන ඒමට යෙදූ අමතර ආයෝජනය මෙම සටහන අනුව නොමේරූ සිට මේරූ කොටසට මාරු කර ඇත. ඒ අකාරයෙන්ම, ජනවසම කල්බදු පෙර කරන ලද ආයෝජනය වෙනුවෙන්ද නොමේරූ සිට මේරූ දක්වා මාරු වීම් වලට අදාල වෙනස්වීම සටහන් අංක 06 මගින් පෙන්වයි.

ජෛව වත්කම් ගිණුම්කරණ ප්‍රමිත අංක 41 හි දක්වා තිබූ පරිදි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කර අගය හඳුනා ගැනීමේ අවශ්‍යතාවය 2012 මාර්තු 02 දින වරලත් ගණකාධිකාරි ආයතනයෙන් නිකුත් කළ නිර්දේශයන් හා නියමයන් මගින් අවලංගු වේ. ඒ අනුව සමාගම ජෛව වත්කම් අගය කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 -දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව පිරිවැය මත සිදු කරනු ලබයි.

වගා වියදම් මූල්‍යනය කිරීම සඳහා විශේෂිත ණය පහසුකම් ලබාගෙන නොමැත. එම නිසා ණය පිරිවැය වර්ෂය තුළ නොමේරූ වගාවන් යටතේ ප්‍රග්ධනිත කර නොමැත. (2017 නොමැත)

### 7.2 ජෛව වත්කම් - පශු සම්පත්

| | | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| කිරි පශු සම්පත් | **07.2.1** | 10,929,500 | 20,997,000 |
| වෙනත් පශු සම්පත් | **07.2.2** | 5,167,112 | 4,240,670 |
| | | **16,096,612** | **25,237,670** |

**ගිණුම්කරණ සටහන්**
දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

### 7.2.1 කිරි පශු සම්පත්

| | නොමේරූ දෙනුන් පැටව් / වැස්සියන් රු. | මේරූ දෙනුන් (කිරි දෙන සහ නොදෙන දෙනුන්) රු. | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|---|
| ජනවාරි 01 දා ට | 996,000 | 20,001,000 | 20,997,000 | 9,506,500 |
| වර්ෂය තුළ එකතු වූ | 192,000 | | 192,000 | 440,000 |
| වර්ෂය සධාරණ අගයට ලද ලාභය/පාඩු | (402,000) | (7,146,500) | (7,548,500) | 11,409,000 |
| මාරු කිරීම ඇතුළට/පිටතට | 1,606,000 | 244,000 | 1,850,000 | 285,500 |
| මරණ/විකුණුම් | (298,000) | (4,263,000) | (4,561,000) | (644,000) |
| දෙසැම්බර් 31 දා ට | **2,094,000** | **8,835,500** | **10,929,500** | **20,997,000** |

පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩුකිරීමෙනි. පශු සම්පත් සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කළ චක්‍රලේඛයට අනුව තීරණය කරනු ලබයි.

### 7.2.2 වෙනත් පශු සම්පත් (ධාරක ජෛව වත්කම්)

| | මී හරක් රු. | කරත්ත ගොන්නු රු. | පට්ට ගොන්නු රු. | බැටළුවන් රු. | එළ හරක් රු. | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි 01 දා ට | 1,563,000 | 781,670 | 133,500 | 1,437,500 | 325,000 | 4,240,670 | 3,932,100 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 195,500 | 220,000 | | 195,000 | 10,000 | 620,500 | 312,500 |
| මාරු කිරීම් ඇතුලට /පිටට | (126,000) | - | 126,000 | - | - | - | |
| මරණ/ විකුණුම් | (77,000) | (111,140) | | (393,000) | (66,000) | (647,140) | (1,067,500) |
| වර්ෂය තුළ ධාරක අගය වැඩිවීම (අඩුවීම) | 958,880 | 33,702 | (48,000) | 8,500 | | 953,082 | 1,063,570 |
| | **2,514,380** | **924,232** | **211,500** | **1,248,000** | **269,000** | **5,167,112** | **4,240,670** |

### 7.3 පරිභෝජ්‍ය ජෛව වත්කම් - දැව වගාව

| | 2017 රු. නොමේරූ | 2017 රු. මේරූ | එකතුව | 2016 රු. නොමේරූ. | 2016 රු. මේරූ | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 2,784,550.90 | 39,460,950 | 42,245,501 | 2,765,443 | 34,331,027 | 37,096,469 |
| සංවර්ධනය/ආයෝජනය මත සිදුවන වැඩිවීම | 21,500 | | 21,500 | 19,108 | | 19,108 |
| වටිනාකම අඩු වැඩිවීම තුළ හඳුනාගත් ලාභ හෝ අලාභ | | 20,486,923 | 20,486,923 | | 5,154,465 | 5,154,465 |
| දැව ගස් හෙලීම නිසාවු වටිනාකමේ අඩුවීම | | (8,231,482) | (8,231,482) | | (24,542) | (24,542) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **2,806,051** | **51,716,391** | **54,522,442** | **2,784,551** | **39,460,950** | **42,245,501** |

ජෛව වත්කම් පරිවර්තනය මූල්‍යමය වටිනාකමක් දක්වා වර්ධනය වී නොමැති විට නොමේරූ දැව ගස් සඳහා වන පිරිවැය දළ සාධාරණ අගයක් වශයෙන් සැලකේ.

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමවේදය යොදා ගනිමින් ටී.එම්.එච්. මුතාලිෆ් මහතා මගින් අදාල තක්සේරුකරනය සිදු කෙරිණි. දැව ගස් වල සධාරණ අගය නිශ්චය කිරීමේදී සියලු වතු ආවරණය කරමින් භෞතික නිශ්චය කිරීමක් සිදු කරන ලදී.

**ගිණුම්කරණ සටහන්**
දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

**තක්සේරුකරණයේදී යොදා ගැනුණු මූලික උපකල්පන**

1. රාජ්‍ය දැව සංස්ථාවේ දැව මිල ලේඛණය පදනම් කරගෙන ඇත.
2. වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන ශුද්ධ විකුණුම් මිල ගණනය කිරීම සඳහා යොදාගෙන ඇත.
3. වට්ටම් අනුපාතිකය 14%
4. පරිනතවීමේ කාලසීමාව අවු 30 ක් ලෙස තක්සේරු කර ඇත.

ශුද්ධ වර්තමාන වටිනාකම මත පදනම්ව බාහිර තක්සේරුකරණය දැව ගස් වල දිගු කාලීන හානි වීම සැලකිල්ලට ගෙන ඇත. විචල්‍යන්ගේ වෙනස් වීම හේතුවෙන් සාධාරණ අගය මත ජෛව වත්කම් තක්සේරු කිරීමේදී පවතින ඒ හා බැඳුණු අස්ථාවරත්වය හේතුවෙන් ඒවායේ පවතින වටිනාකම තත්‍ය වටිනාකමින් වෙනස්විය හැක.

සමාගම සිය දැව ගස් සම්බන්ධයෙන් පහත දැක්වෙන අවදානම්වලට නිරාවරණය වේ.

**නියාමන සහ පාරිසරික අවධානම**

සමාගම ශ්‍රී ලංකාවේ නීති රීති හා රෙගුලාසිවලට යටත්වේ. දේශීය පාරිසරික සහ වෙනත් නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීම සඳහා සමාගම පාරිසරික ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් පිහිටුවා ඇත. පාරිසරික අවදානම් හඳුනාගැනීම සඳහා කළමනාකාරිත්වය මගින් නිරන්තර විමර්ෂණයන් සිදුකෙරේ.

**සැපයුම් සහ ඉල්ලුම් අවදානම**

